

# كيف اهتديت إلى التوحيد

# අඳුරෙන් එළියට

باللغة السنهالية

# අඳුරෙන් එළියට

කතෘ
මුහම්මද් ජමීල් සයිනු

සිංහලෙන්
අබ්දුල් හකීම් මුහියිද්දීන්

නිරීක්ෂණය
මුහම්මදු නාසිම්

HOUSE OF THE PROPER KNOWLEDGE
FOR PUBLISHING & DISTRIBUTION
Riyadh- 11438 P.O.Box 32659 Tel 4228837 Fax 2933407

ⓒ دار الورقات العلمية للنشر والتوزيع ، ١٤٢٥هـ

**فهرسة مكتبة الملك فهد الوطنية أثناء النشر**

زينو، محمد جميل
كيف اهتديت إلى التوحيد. / محمد جميل زينو؛ عبدالحكيم محي الدين.- الرياض، ١٤٢٥هـ
٦٤ ص؛ ١٢ × ١٧ سم
ردمك: ٨ - ٨ - ٩٥٨٣ - ٩٩٦٠
(النص باللغة السنهالية)
١- زينو، محمد بن جميل ٢- الإسلام - تراجم أ. محي الدين، عبدالحكيم (مترجم) ب. العنوان
ديوي ٩٢٢,١ ١٤٢٥/٥٦٨٤

رقم الإيداع: ١٤٢٥/٥٦٨٤
ردمك: ٨ - ٨ - ٩٥٨٣ - ٩٩٦٠

**حقوق الطبع محفوظة**

**الطبعة الأولى**

**١٤٢٥هـ - ٢٠٠٤م**

بسم الله الرحمن الرحيم

## පෙරවදන

මහා කාරුණික අති දයාන්විත අල්ලාහ්ගේ නාමයෙන්, පැසසුම් සියල්ල සර්වඥාන අල්ලාහ්ට අයත්වේ. ඉතසිතින් ඔහු ප්‍රශංසා කර ඔහුගෙන්ම සහාය සහ දයාව පතා සිටිමු. අපගේ පාපයන් හට ඔහුගෙන්ම පවසමා අයදිමු. පව් සහ නින්දිත ක්‍රියාවන් හට ලක් නොවී සිටීමටද ඔහු ගෙන්ම සහාය පතමු. කරුණාබර අල්ලාහ් පෙන්වන යහ මග කවරෙකුට ලැබෙන්නේද, හෙතෙම නොමග යැවීමට කිසිවෙකුට කළ නොහැකිය. එමෙන්ම අල්ලාහ්ගේ සුමග කවරෙකුට නොලැබෙන්නේද, ඒ තැනැත්තා යහමගට කිරීමට කිසිවෙකුට කළ නොහැකිය. තවද වැඳීමට සුදුසු එකම සත්‍ය දෙවියා අල්ලාහ් හැර අන් කිසිවෙකු නැති බවත්, මුහම්මද් (සල්) තුමා අල්ලාහ්ගේ කීකරු අත වැසියා සහ වක්තෘ වරයා බවත් මම සාක්ෂි දරමි.

තුර්කියේ කුනියා නම් ගමක සිට ශිෂ්‍යයෙකු මට ලියන ලද ලිපියේ මෙසේ සඳහන් විය.

මක්කාවේ ධාරුල් හදීස් අල් කයිරියියා ධහම් විද්‍යා පීඨයේ ආචාර්ය ජමීල් සයිනූ මහතා වෙතයි,

අස්සලාමු අලෙයිකුම් වරහ්මතුල්ලාහි වබරකාතුහු.

මහාත්මයාණනි, තුර්කියේ මාකුනියා විශ්වවිද්‍යාලයේ ඉස්ලාමීය නීති පීඨයේ අධ්‍යාපන හදාරන සිසුවෙක් වෙමි. ඔබ විසින් රචිත 'අකීදා අල් ඉස්ලාමියා' හෙවත් ඉස්ලාමීය සංකල්පය නම් පොත කියවා දැනුමක් ලබාගත් අතර ඉස්ලාමීය සංකල්පයේ මනා දැනුමක් නැති මා වැනි අප රටේ අනෙකුත් අය එයින් යම් ප්‍රයෝජනයක් ලබාගත යුතුයැයි යන පරම චේතනාවෙන් ඒ පොත මගේ බසට පරිවර්තනය කළෙමි.

එසේම අප දැනගනු වස්, ඔබගේ කුඩා අවධිය සහ පසුකළ ජීවන මාංපෙත්ත ගැනද ඔබකෙසේ සත්‍ය ඒකීය මාවතට යොමුවීද වැනි සුවහසක් කරුණු ගැනද ලියා පළ කරන්නේ නම් එය ප්‍රයෝජවත් වනු ඇතැයි අපේක්ෂා කරමි. එහෙයින් එවැනි කරුණු ගොනු කර මගේ පහත සඳහන් ලිපිනයට එවනු මෙන් කරුණාවෙන් ඉල්ලා සිටිමි. ස්තුතියි. වස්සලාමු අලෙයිකුම්. මෙයට බිලාල් ෆාරුම්පි

මෙලෙස මගේ අවුරුදු හැත්තෑවක් වන ජීවිත කාලය තුල මවිසින් ලියන ලද සමහර ලිපි සහ කෘතීන් කිය වූ ලොවෙ නන්දෙස ජීවත්වන තවත් බොහෝ දෙනෙකු මා අල්කුර්ආන් සහ හදීස් වෙත නැඹුරු වූ ආකාරය සහ ඒ අනුව කටයුතු කර ඒ තුලින් ලබාගත් අත් දැකීම් සහ කරුණු ගැන ලියා එවන ලෙස මා වෙත යොමු කළ ලිපි අනන්ත අප්‍රමාණය.

හුදෙක් පවසනාවනම් යමෙකු අල්ලාහ්ගේ ඒකියත්වය තුලින් ලබාගත් සතුට සහ මිහිර ලොවේ අන් කිසිවෙකු කිසිදු ලෙස ලබා ගත්තා යැයි කිව නොහැකිය. එහෙයින් මුහම්මද් තුමා ඒ කරුණම මෙසේ පැවසුවා විය හැකිය. 'අල්ලාහ් දෙවිඳු තම හිමි ලෙසද ඉස්ලාම් දහම තම ජීවන මග ලෙසද මුහම්මද් තුමා තම වක්තෘ වරයා සහ මග පෙන්වන්නා ලෙසද පිළිගෙන ඒ අනුව කටයුතු කරන්නේ කවරෙක්ද ඔහු භුක්ති විඳින සතුට නියම ඊමානයේ සතුට වන්නේය'.

මගේ කුඩා අවධිය කෙසේ වීද? මගේ සමාජ වැසියන් සහ මා අවට ජීවත්වූ ජනයන්ගේ ජීවන රටාව කෙසේ වීද? ඔවුන්ගේ ආගමික වත්පිළිවෙත් සහ සංකල්පනා කෙසේ වීද? මවුන් හා එකට එක්ව සිටි මවුන්ගේ මති මතාන්තවලට නැඹුරු වී සිටි මා මවුන් විසින් පිළිපැදූ

බොල් සමාජ පද්ධතියෙන් දුරස්ථ වී ඉස්ලාම් දහම පව සන සත්‍ය සංකල්ප සහ නීතිරීති වෙත ඇදුනේ කෙසේද? වැනි බොහෝ කරුණු මෙම කුඩා අත්පොත තුලින් සංක්ෂිප්තව ඔබ අභිමුඛයේ තැබීමට වෙර දරා ඇත්තෙමි.

එහෙයින් මෙම කුඩා අත්පොත කියවන්නාද මා සඳහන් කරන සත්‍ය ඉස්ලාම් දහමෙන් ඈත්වී නොමග සිටින්නේ නම් ඒ ව්‍යාජ රාමුව තුලින් ඉවත්වී සත්‍ය සන්මාර්ගය කුමක්ද? ව්‍යාජ මගපෙන්වීම කුමක්ද? යන්න සැකෙන් සහ ඌනයෙන් තොරව වටහා ගැනීමට අවස්ථාවක් වනු ඇතැයි බලාපොරොත්තු වෙමි. එහෙයින් මෙම කුඩා පොත මගින් මුසමහත් මුස්ලිම් සමාජයේම සියළු දෙනා ප්‍රයෝජන ලබා තම ජීවිතය ඍජුමගකට යොමු කර ගෙන ජීවත් වන්නට වරම් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන අතර මම මට හැකි ලෙස කරුණාබර අල්ලාහ් දෙවිඳු වෙනුවෙන් කළ සත් ගුණ වත් ක්‍රියාවන්ගෙන් එකක් අනුමත කරනු ඇතැයි ඒ අල්ලාහ් දෙවිඳුගෙන්ම අයද සිටිමි. මුහම්මද් බින් ජමීල් සයිනු

උපත : මැදපෙරදිග රටක් වන සිරියාවෙ හලබ් නම් ගම්මානයේ වර්ෂ 1925 උපත ලැබූ මා දැනට මගේ ජීවිතයේ අවසානට පත්වූ කෙනෙකු වෙමි. මා අවුරුදු දහයක් පමණ වන විට මුලින්ම අප ගමේ කුඩා පාසැලට ඇතුල් වී අකුරු ලියන්නට කියවන්නට පටන් ගත්තෙමි. පසුව අසල ගමේ පිහිටි ධාරුල් හිෆාල් නම් පාසැලට ඇතුල්වී එහි අවුරුදු පහක් පමණ අධ්‍යාපනය හැදෑරු අතර එහිදී අල්කුර්ආනය මනා අන්දමින් එහි ශෛලයාශ්‍රි තව කියවන්නට වනපොත් කළෙමි.

පසුව අප ගමේ පිහිටි අව්කාෆ් අල් ඉස්ලාමියියා නම් ආයතනය යටතේ ක්‍රියා වන කුල්ලියතුෂ් ෂරීආ අල් තාජ්හීසියියා නම් ඉස්ලාමීය නීති කොලීජියට ඇතුල් වී

මගේ උසස් අධ්‍යාපනය අධ්‍යයනය කරන්නට පටන් ගත්තෙමි. ඒ අධ්‍යාපන නිකේතනය දැනට සනවියියා අෂ්ෂර්ඉයියා යන නමෙන් නම සේවය ප්‍රසාරණය කර මින් ඉස්ලාමීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ මෙන්ම අනෙකුත් අධ්‍යාපන කටයුතු සම්බන්ධවද වැදගත් ස්ථානයක් හොබවන්නේය. එහිදී මා අල්කුර්ආනය විවිධ බොල් මතිමතාන්වලට නුඹුරු වූ සංකල්පය ආශ්‍රිතවද, ඉස්ලාමීය නීති, ඉතිහාසය, හදීස් සහ අනෙකුත් නීති පද්ධති මෙන්ම සත්‍ය ඉස්ලාම් භක්තිකයෙකු හදාරන්නට අකැමති තවත් විෂයන්ද හැදෑරුවෙමි.

තවද ඉස්ලාමීය ඒකියත්වයේ මූලික හරය වන තව්හීද් අල් රුබූබියියා නම් දේවත්වයේ ඒකියත්වය විදහා පාන සංකල්පය ගැන විස්තර කරන දැනුම අල්හුසුනුල් හුමයිදියියා නම් ග්‍රන්ථයෙන් ඉගෙන ගත් බව මගේ මත කයේ තවමත් රැඳී පවතී. කල් ගතවන විට අල්ලාහ් දෙවිඳුගේ ඒකීය සංකල්පය ඒ අනුව පමණක් හැදෑරීම වැරදි සහගත බවත්, ඒ වැරැද්දම අද ලොවේ නන් දෙස ඉස්ලාමීය අධ්‍යාපනය හදාරන බොහෝ මුස්ලිම් වරු සහ කතාවරුන් කරන බවත්, ඒ තුලින් මනා ඉස්ලාමීය දැනු මක් සාක්ෂාත් කර ගන්නට බැරි බවත් නොබෝ දිනකින් වටහා ගන්නට හැකි විය.

මන්දයත් මුහම්මද් තුමාගේ සමයේ ජීවත් වූ බොහෝ කුරයිෂ් මිසදිටුවන් පවා තමාගේ නිර්මාතෘ වරයා අල්ලාහ් දෙවිඳු බව පරිසමාප්තව පිළිගෙන සිටි නමුදු, මවුන් උදව් උපකාර පැතීමේදී අල්ලාහ් සමග අන් ව්‍යාජ දෙවිවරුද ඇමතූ බවත් අල්ලාහ් දෙවිඳුගේ පරිශුද්ධ වදන් මෙසේ විස්තර කරයි :

*මොවුන් නිර්මාණය කෙළේ කවුරුන්දැයි ඔබ මොවුන්ගෙන් විමසූ කළ, අල්ලාහ් යයි පවසනු ඇත. එසේ නම් මොවුන් කෙසේ නොමග හැරවනු ලබන්නෝද?* (44 : 87)

එසේ තමාගේ නිර්මාතෘ වරයා වන දෙවි කෙනෙකු සිටින බව පිළිගත්තද එසේ පිළිගැනීමෙන් පමණක් කෙනෙකු සත්‍ය මුස්ලිම් වරයෙකු විය නොහැකිය. එසේම ඒහා සම්බන්ධ වන්දනාමාන කටයුතු සියල්ල සඳහා එකම සුදුස්සා ඔහු බවත් ඔහුගේ නාම සහ ගුණාංගද මනා ලෙස වටහා ගෙන පිළිගත යුතු බවත් මුහම්මද් තුමා තමා හා විසූ මිස්දිටු සමාජ වැසියන් හට විස්තර කළ විට ඔවුන් මුහම්මද් තුමාගේ ඒ මතයට එරෙහිව සටනක් කිරීමටද සිදුවූ බව ඉස්ලාමීය ඉතිහාසය තුල සාක්ෂාත්ව පවතී.

එසේම අල්ලාහ් දෙවිඳු විසින් ශාප කර පලවා හරින ලද ෂයිතාන් පවා තමා නිර්මාණය කළ අති උසස් දෙවියෙකු, හිමියෙකු සිටින බව ස්ථිරසාරව පිළිගත් බව අල්කුර්ආනයේ ෂයිතාන් 'මගේ හිමියනි' යනුවෙන් ආමන්ත්‍රණය කිරීම තුලින් සාක්කි දරයි.

*මගේ හිමියනි, ඔබ මා වැරදි යන්නට සැලැස්වූ බැවින් සැබැවින්ම මම මිහිපිට (නොමග යන සියළු මං) ඔවුනට ලස්සන කර පෙන්වා ඔවුන් සියල්ල නොමග යවමි යි (ෂයිතාන්) පැවසුවේය.* (15 : 39)

නමුදු මුස්ලිම් වරයෙකු කුමන සංකල්පයක් පිළිගැනීමෙන් එලොව මෙලොව දෙලොවම ජය ගත හැකිදෝ ඒ ඒකේශ්වර වාද සංකල්පය පමණක් පිළිගෙන, අල්ලාහ් දෙවිඳු පමණක් වැඳ, ඔහුගෙන් පමණක් උදව් උපකාර පැතිය යුතුය යන්න වටහා දෙන සංකල්පයක් මම හෝ ඒ අධ්‍යාපන නිකේතනවල අධ්‍යාපනය හැදෑරූ අනෙකුත් අය හෝ අධ්‍යයනය කෙළේ නැත. එවැනි අනූන සංක

ල්පයක් ගැන වටහා ගත්තේද නැත. නමුදු අල්ලාහ් දෙවිඳු වක්තෘවරුන් ඒ ඒ සමාජ වලට මගපෙන්වන්නන් ලෙස පත් කළ අවස්ථාවේ ඔවුන් ඒ ඒකේශ්වර වාද ධර්මය ගැන අනතුරු අඟවා මිස ඔවුන් පත් කළේද නැත යන්න අල්කුර්ආනය තුලින් සාක්ෂාත් කරගත හැකිය. වක්තෘ වරුන්ගේ දම්වැලේ අවසන් පුරුක වන වක්තෘ මුහම්මද් තුමා පවා තම සමාජ වැසියන් ඒ සංකල්පය වෙත ඇමතූ විට ඔවුන් එය නොපිළිගෙන මුරණ්ඩු ලෙස උඩඟු වී ප්‍රතික්ෂේප කළ බව ශුද්ධවූ අල්කුර්ආනය සාක්කි දරයි.

*අල්ලාහ් හැර අන් දෙවියෙකු නැත යනුවෙන් ඔවුනට කී කළ ඇත්තෙන්ම ඔවුන් උඩඟු කමෙක් පසුවූහ.* (37 : 35)

මුහම්මද් තුමාගේ ප්‍රචාරයේ මුල්පසේ අල්ලාහ් දෙවිඳු තම නිර්මාතෘ වරයා ලෙස පිළිගත් ඒ මිසදිටුවන් අල්ලාහ් හා තමන් විසින් ආරූඪ කරගත් තවත් බොහෝ ව්‍යාජ දෙවිවරු වන්දනාමානය කරමින් පසුවූහ. අල්ලාහ් දෙවිඳුට කරන වන්දනාමාන හා සමාන ගරුබුහුමන් ඒ ව්‍යාජ දෙවිවරුන් උදෙසාද භක්ති පූර්වව කළහ. එහෙයින් මුහම්මද් තුමා විසින් ප්‍රචාරය කළ සත්‍ය ඒකේශ්වර වාද ධර්මය පිළිගෙන ඒ අනුව කටයුතු කරන විට මෙතෙක් කල් තමන් විසින් ගරුබුහුමනට ලක්වූ ව්‍යාජ දෙවිවරු වෙතින් ඉවත් විය යුතුය යන සත්‍යය වටහා ගෙන මුහම්මද් තුමා විසින් ප්‍රචාරය කරන ලද ඒකේශ්වාද ධර්මයට එරෙහිව සහමුලින්ම නැගී සිටියහ. නමුදු වත්මනයේ බොහෝ රටරාජ්‍යවල ජීවත්වන මුස්ලිම්වරු ඒ ඒකේශ්වර වාද සංකල්පය පිළිගෙන සිටියද වන්දනාමාන කිරීමේදී අල්ලාහ් හැර අන් ව්‍යාජ ඉස්ලාම් දහම නොපවසන ඉස්ලාම් දහම තරයේ හෙළා දකින විවිධ ආරයෙන් වූ වන්දනාමාන කීපයකට යටත් වී පසුවනු ඒද්නෙදා අප දෘෂ්ටියට සුලභව හසුවෙයි.

එසේම අල්ලාහ් දෙවිඳුගේ නාම සහ ගුණාංගයන් ගැන වටහා ගැනීමේදී අප අධ්‍යාපනය හැදෑරූ නිකේතන ඒවාට අර්ථ කථනය කළේ එහි නියම අර්ථයට විකෘති වන අන්දමින් බව පසු කාලයේදී අප මම වටහා ගත් තෙමි. එහි ප්‍රධාන වාක්‍යයක්වන මතු සඳහන් වාක්‍ය ගැන මදක් සළකා බලමු.

﴿الرَّحْمَنُ عَلَى الْعَرْشِ اسْتَوَى﴾

*දයාළු වන්තයා අර්ෂ් (සිහසුන) ට (ඉහළින් තම සම්භාවණයට සුදුසු පරිදි) උස් විය.* (20 : 5)

ඉහත සඳහන් අල්කුර්ආන් වැකියේ උස් විය, ඒ මත විය යන අදහස නියෝජනය වන إستوى ඉස්තාවා යන අරාබි වදනට සමහර මගේ ඇදුරන් 'ආක්‍රමණය කර ගත්තේය' යනුවෙන් අර්ථවත් කළ අයුරු තවමත් මගේ මතකයෙන් ඉවත් වී නැත. නමුදු සමහර තාබිර්න්වරු පවසන විට

﴿ثُمَّ اسْتَوَى إِلَى السَّمَاءِ﴾

*පසුව මහු අහස කෙරෙහි (අදහස් වී) උසස් වී ස්ථිර විය.* (2 : 29) යන වැකියෙහි නියෝජනය වන අදහස දෙන අරාබි වදන වන إستوى අරාබි වදනට බුහාරි ග්‍රන්ථයේ මුජාහිද් සහ අබුල් ආලියා වැනි විද්වතුන් 'උසස් වී ස්ථිර විය' යනුවෙන් අර්ථ කථනය කරයි.

සත්‍ය මුස්ලිම්වරයෙක් ඒ වචනය වෙනුවෙන් බුහාරි ග්‍රන්ථයේ සඳහන් වී ඇති තාබිර්න් වරුන්ගේ අදහස පිටුදැක වෙනත් අදහසක් ගැනීම කිසිසේත් සුදුසු නැත. එසේ අප අප සිත්සේ අදහස් කරන විට අල්ලාහ් අර්ෂ් එනම් සිහසුන මත සිටී යනුවෙන් ඉමාම් අබූහනීෆා සහ ඉමාම් මාලික් වැන්නන්ගේ අදහස පිටුදැකින බව සිතේ

තබා ගත යුතුය. හනෆි මද්හබ් පාර්ශවය පිළිගනිමින් පසුවන ඉමාම් වන අබූහනීෆා පවා 'යමෙකු අල්ලාහ් පසුවන්නේ අහසෙහිද නොවන්නට පොළොවෙහිද යන්න තමා නොදනී' යනුවෙන් පවසන්නේ නම් ඔහු කාෆිර් වරයෙකු වේ යනුවෙන් පවසයි. මන්දයත් අල්ලාහ් දෙව්දුම ඒ කරුණ ගැන පැහැදිළිවම අල්කුර්ආනයේ පවසයි :

﴿الرَّحْمنُ عَلَى الْعَرْشِ اسْتَوَى﴾

*දයාළු වන්තයා (තම සම්භීවණයට සුදුසු පරිදි) අර්ෂ් (නම් සිහසුන මත ඔහුට කෙසේ සුදුසු දෝ එසේ) උස් විය.* (20 : 5) තවද අල්ලාහ්ගේ සිහසුන වන අර්ෂ් සප්ත අහසට ඉහළින් තිබෙන බව ඉස්ලාම් දහම සක්සුදක්සේ පැහැදිලි කරන බව අප වටහා ගත යුතු අතර ඒ අනුවම කිසිදු වෙනසක් අඩුවැඩි කිරීමකින් තොරව පිළි ගත යුතුය.

හිජ්රි 1348 වන වසරේ මා සාමාන්‍ය පෙළ විභාගයෙන් සමත්වී උසස් පෙලට තේරීපත්වූ ඒ වසරේම අල්අස්හර් විශ්ව විද්‍යාල ප්‍රවේශ විභාගයටද ඉදිරිපත් වී එයින්ද විශිෂ්ට ලෙස සමත්වී ඒ විශ්ව විද්‍යාලයට තේරී පත් වූනෙමි. නමුදු මගේ ශරීර සෞඛ්‍ය දුර්වල වූ හෙයින් එහි යැමට නොහැකි විය. පසුව සිරියාවෙම ධාරුල් මුඅල්ලිමීන් නම් අධ්‍යාපන නිකේතනයේ ගුරුවරයෙකු වශයෙන් සේවයට පත්ව එහි පුරා අවුරුදු විසිනවයක් සේවය කර විශ්‍රාම ගියෙමි.

1399 වසරේ උම්රා කර්තව්‍ය ඉටු කරනු වස් මක්කා නගරයට ගිය මට එහි ප්‍රබල ඉස්ලමීය විද්වතෙකු වන අභාවප්‍රාප්ත අබ්දුල් අසීස් බින් බාස් තුමා මුණ ගැසෙ න්නට අවස්ථාවක් උදා විය. ඒ මුණගැසීම තුලින් මා අල්කුර්ආනය සහ හදීස් ආශ්‍රිත සත්‍ය ඉස්ලාමීය සංකල්පයේ සිටින බව දැනගත් මහු හජ් කටයුත්ත වෙනුවෙන්

දුරබැහැර සිට පැමිණෙන අරාබි වන්දනා කරුවන් වෙනුවෙන් මක්කා දේවස්ථානයේ ආගමික දෙශන සහ දහමාශ්‍රිත කරුණු පන්ති පවත්වන ලෙස මාගෙන් ඉල්ලා සිටියේය. මා ඔහුගේ ඒ ඉල්ලීම අගය කොට සළකා එසේ කටයුතු කිරීමට මගේ සම්පූර්ණ කැමැත්ත පළ කළෙමි.

හජ් කටයුත්ත අවසාන වනවාත් සමග ඉස්ලාමීය ආගමික දේශනා වැඩ මුලුවක් සඳහා ජෝර්දාන් රටට යන ලෙස අබ්දුල් අසීස් මහතා මගෙන් ඉල්ලා සිටියහ. ඒ ඉල්ලීම පිළිගත් මම ජෝර්දානයේ රම්දා නගරයේ සලා හුද්දීන් ජුම්ආ දේවස්ථානයේ විශේෂ ඉමාම් ලෙසද කතීබ් ලෙසද අල්කුර්ආනය අර්ථානුසාරයෙන් උගන්වන ගුරුවර යෙකු ලෙසද සේවය කරන්නට පටන් ගත්තෙමි. එසේම ඉඩ ලැබුණු සෑම අවස්ථාවකදීම අවට වැසියන් හටද ඉස්ලා මීය ඒකේශ්වර වාද ධර්ම සංකල්පය ගැන පැහැදිළි කරන්නට උනන්දු වුනෙමි. වැඩි කල් යන්නට මත්තෙන් ඒ ගම් වැසියන්ද ඉස්ලාමීය මූලික ප්‍රතිපත් තියේ කරුණු ගැන මනා දැනුමක් ලබා ගත් අතර එය මගේ ඉස්ලාමීය ප්‍රචාරක කටයුතුවල ඉමහත් ජයග්‍රහණයක් ලෙසද කිව හැකිය.

හජ්රි 1400 වන වසරේ රමදාන් මාසයේදී නවත් උම්රා කටයුත්තක් වෙනුවෙන් නැවත වරක් මක්කා නගරයට ගොස් හජ් සමය වන තුරු එහි රැඳී සිටියෙමි. එහිදී මක්කා නගරයේ ධාරුල් හදීස් අල් කයිරිය්‍යා නම් කොලීජියේ අධ්‍යාපනය හරාදර සිසුවෙකු මුණ ගැසෙ න්නට අවස්ථාවක් ලැබුණි. ඔහු සමග දීර්ඝ කතාවක යෙදී සිටියදී නම පාසැලේ ගුරුවරුන්ගේ අඩුවක් ඇති බව පවසා කැමැති නම් එහි ගුරුවරයෙකු ලෙස බැඳී හදීස් ආශ්‍රිත විෂය උගන්වන ගුරුවරයෙකු ලෙස කටයුතු කරන ලෙසද

ඒ සඳහා අවස්ථාවක් වෙනුවෙන් උත්සාහ කරන බවද ඉල්ලා සිටියේය.

ඒ සිසුවාගේ ඇරයුම පිළිගත් මා එහි විදුහල්පති මුණ ගැසුණු මා ඔහු සමග සාකච්ඡා කිරීමෙන් පසු ඔහු මගේ සේවය බලාපොරොත්තු වන තම කැමැත්ත අඟවා සිටියේය. තවත එහි සේවය කරන්නට නම් අබ්දුල් අසීස් ඉබ්නු බාස් තුමාගේ සහතිකයක් රැගෙන එන ලෙසද ඉල්ලා සිටියේය. අබ්දුල් අසීස් බින් බාස් තුමා මුණ ගැසී මා මගේ කැමැත්ත ගැන ඔහුට දැන්වූ කළ ඔහු ඉතා සතුටෙන් සහතිකයක් ලියා මා ඒ නිකේතනයේ ගුරුවරයෙකු ලෙස සේවයට බඳවා ගන්නා ලෙස එහි විදුහල්පතිටද පුද්ගලිකව ලිපියක් ලීවේය. එදා සිට මා ඒ අධ්‍යාපන නිකේතනයේ කුර්ආන් අර්ථකථනය, තව්හීද්, හදීස් සහ ආගමික නීතිරීති සම්බන්ධ විෂයන් උගන්වන ගුරුවරයෙකු ලෙස සේවය කරමි. මේ මගේ ජීවිත කතාවේ සංක්ෂිප්ත කරුණු රැසකි.

නක්ෂබන්දි තරීකා වරායකු ලෙස

කුඩා අවධියේ සිටම දේවස්ථානවල පවත්වනු ලබන දික්ර් පන්තිවලටද සහභාගි වීම පුරුද්දක් ලෙස පත් කරගෙන සිටියෙමි. විශේෂයෙන්ම අප ගම්දනව්වල තරීකා යනුවෙන් නාමධාරී කරගෙන ඒවාටම අයත් විශේෂ ලක්ෂණයෙන් හෙබි දික්ර් උත්සව පැවැත්වීම සාමාන්‍ය සංසිද්ධීන් ලෙස විය. වරෙක නක්ෂබන්දියා තරීක්කා අය විසින් පවත් වන ලද එක් දික්ර් උත්සවයක් වෙනුවෙන් සහභාගි වුනෙමි. ඒ උත්සවය භාරව මූලිකව කටයුතු කළ ෂේක් මා උනන්දුවෙන් කටයුතු කරන කුඩා ළමයෙක් නිසා මවුන්ගේ තරීක්කා සභාවට එක්කර ගනු වස් මවුන්ගේ විර්දු හෙවත් සමහර දික්ර් උගන්වන්නට සැළැසුවේය. මා කුඩා කොලුවෙකු නිසා මවුන් විසින් උගන්වනු ලැබූ ඒ දික්ර් පහසුවෙන්

ඉගෙන ගැනීමට මට අපහසු විය. එසේ ඒ දික්ර් අපහසු එකක් වූවද එයින් ඉවත් නොවී ඒ උත්සව වලට සහභාගි වී ඔවුන් කියන කියුම්, මිහිරි තාලයකින් ඇදීපෑදී ගයන ගැයුම් සහ ඒවාගේ ස්වර වලට උනන්දුවෙන් ඇහුම්කන් දීම මගේ විනෝදාංශයක් බවට පත්විය.

එසේම ඔවුන් කියන කියුම්වල සහ ගයන ගැයුම්වල ඔවුන්ගේ නායකයන්ගේ, පූජකයන්ගේ නම් සඳහන් වන විට ඉතා උනන්දුවෙන් උස් ස්වරයකින් ඔවුන් ප්‍රශංසා කර කෑ ගසාන පුරුද්දක්ද ඒ සභාව තුල විය. මධ්‍යම රාත්‍රී කාලයේ එසේ පවත් වන ලද උත්සව වල තම පූජක යන්ගේ නම් සඳහන් වන විට නැගෙන උස්ස්වරයෙන් වූ කෑ ගැසිල්ල නිසා මා බියට පත්වූ වාරද අනන්තයි. මා තරමක ලොකු වූවාට පසු ඔවුන් විසින් පවත්වන ලද කත්ම් නම් උත්සව වලට සහභාගි වනු වස් මගේ සමීපතම නෑයෙකු සමග වරක් සහභාගි වුනෙමි. එහි සභාවක ඒ තරීකාවේ නියෝජිතයන් පිරිසක් කවයක හැඩයකට වාඩිවී සිටී අතර ඔවුන්ගේ ගුරු හෙවත් ප්‍රධානියා ඒ කවය මැද ගාම්භීරව වාඩිවී සබයේ අය උනන්වෙන් බලා සිටිනු දැක ගන්නට හැකි විය.

පසුව ඔහු නැගිට තමා වටා වාඩිවී සිටී අයට ගල් කීපයක් දී අල්ෆාතිහා, අල්ඉක්ලාස් අෂ්ෂරීෆ් යනුවෙන් විධානය කළේය. ඔහු එසේ විධානය කළ වහාම වාඩි වී සිටී සෙසු අය තමන් වෙත ලැබුණු ගල් ගැට ප්‍රමාණයට සූරා ෆාතිහා, සූරතල් ඉක්ලාස්, ඉස්තිග්ෆාර් සහ ඒ තරීකා වෙනුවෙන්ම සකසූ මුහම්මද් තුමා වෙනුවෙන් වූ සලවාත් වන ‘අල්ලාහුම්ම සල්ලි මුහම්මදින් අදදද් දවාබ්බී’ යනුවෙන් ආරම්භ කරන සලවාත්ද උසුරන්නට වූහ.

ඉහත ආඥා කළ අත්දමින් ඔවුන් වෙත දෙන ලද ගල් කැට අවසන්වූ වහාම ඒ ගැන තම ප්‍රධාන සභිකයාට දැනුම් දෙනු වස් අවසන් වශයෙන් උසුරන දික්ර් උච්ච ස්වරයෙන් උසුරනු ඇත. එයට සවන් යොමු කරන සභිකයා 'අර්රාබිතා ෂරීෆා' යනුවෙන් පවසනු ඇත. එනම් ඔවුන්ගේ සභාවට අයත් නැසී ගිය පෙර පූජකයන් ඒ දික්ර් සභාවට සහභාගි වී ඒ සභාව දැක සතුටට පත්වන බවත් එසේ දික්ර් පදුවන අය වෙනුවෙන් මැදිහත් වී අල්ලාහ්ට රෙකමදාර කරන බවත් එහෙයින් දික්ර් පදුවන්නන් ඒ කටයුත්ත ඉතා ශාන්තදාන්තව භක්තිපූර්වව කළ යුතු බවත් සභා මූලිකයාගේ ඒ නියෝගයේ තේරුම වේ.

ඔහුගේ ඒ නියෝගයට සවන් දෙන දික්ර්හී සම්බන්ධ අය තම පෙර මුනිවරුන්ගේ කීකරු ගෝලයන් යනුවෙන් නියෝජනය වන්නට තම දික්ර් අවස්ථාව ඉතා උච්ච ස්වරයෙන් අසභ්‍ය ලෙස උඩ පනිමින් කෑ ගසන්නාක් මෙන් කරනු ඇත. ඒ අවස්ථාව කෙතෙක් තීව්‍ර වූවා නම් ඒ සභාවේ දික්ර්වල සහභාගි වූ කෙනෙකු භක්තිය උස්සන්න වී අප සිටි තැන පදුකරගෙන අපගේ උර හිස් උඩින් පැනගෙන යන්නට තරම් විය. එ කාලය පරිජ්ජෙ දයේ මට ඉස්ලාම් දහම මනා දැනුමක් නැති හෙයින් මේ මාග කැගැසීම් සහ නැටීම් ඉස්ලාමීය දහම අනුමත කළ එකක්ද යනුවෙන් මා තුලම අසා ගෙන ඒ සභාවෙන් ඉවත වී ගිය වාරයන් අනන්තයි.

වරෙක උවමනාවක් පිණිස මගේ නැගෙදරකට ගිය අවස් ථාවක ඒ නිවස තුලද නක්ෂබන්දියා තරීක්කා අය විසින් පවත්වන ලද උත්සව සභාවක් වෙනුවෙන් වූ ගායනා වාර යක් පැවැත්වෙමින් තිබුණේය. එහි ගයන ලද ගායනාවලට උනන්දුවෙන් සවන්දුන් මම එක් ගායනාවක 'අපගේ

රොගීන් සහ පිස්සන් සුව කර අපගේ පිටිවහල් වන පූජකා ගැන අපට දැනුම් දෙනු මැනවි' යනුවෙන් අර්ථවත් වන ගැයුමක් ඇසී තිවස තුලට ඇතුල් නොවී මගේ නැයන් අමතා 'ඔබගේ පූජකයන්ගෙන් රෝග සහ පිස්සන් සුව කරන අය දැයි' විමසුවෙමි. එයට මඟු ඔව් යනුවෙන් එක් වචනයෙන්ම උත්තර දුන්නේය.

පසුව මම මගේ නැයන් අමතා 'මැරුණු මිනිසුන් නැවත පණ පොවන්නටද කුෂ්ඨ රෝගයෙන් පෙළෙන්නන් සුව කරන්නටද හැකි විස්කම අල්ලාහ් දෙවිඳු විසින් වක්ත ර්සා තුමාට ලබා දී තිබුණි. එසේ වුවද ර්සා තුමා මැරුණු මිනිසුන් නැවත නැගිටවන්නටද, කුෂ්ඨ රෝගීන් සුව කරන්න්ටද අවස්ථාවක් වූවිට අල්ලාහ්ගේ අවසරය මත සිදුවන ලෙස ඉල්ලුවා මිස තම ස්වශක්තියෙන් එසේ නොකළ බව සුපැහැදිලි නොවේද යනුවෙන් කීවෙමි. එයට නැයන් මවුන් සුව කරන්නේද අල්ලාහ්ගේ නාම යෙන් බව පැවසූහ. එසේනම් ඔබලා අල්ලාහ්ගේ නාම යෙන් යනු වෙන් වූ වචනය උච්චාරණය නොකරන්නේ මන්දැයි විමසා වක්ත ඉබ්රාහීම් තුමා පවා රෝග සුව කරන්නේ අල්ලාහ් බව පවසා ඇත යනුවෙන් පවසා ඒ ගැනවූ අල්කුර්ආන් වාක්‍යද පාරායනය කර පෙන්වූයෙමි.

මා රෝගාතුරවූ කළ සුව කරන්නේ මඟුය. (26 : 80)

නකෂබන්දියා තරීක්කා ගැන වදනක්

නකෂබන්දියා තරීක්කා අනෙකුත් සමහර තරීක්කා සේ අත්පුඩි ගැසීම, නැටීමවැනි නොමනා ක්‍රියාවන් වලින් සමත් නොවී ඉතා සන්සුන් ස්වරයෙන් උසුරන සමහර දික්ර් වලින් සමන්විතය.

දික්ර් කිරීම පිණිස එක්වීම, දික්ර් කරන එක්එක් ගල් කැට බෙදා දීම, කත්ම් උසුරන විට මෙසේ උසුරන්න යනු වෙන් අණ කිරීම භාජනයේ කට මත ගල තබා මෙසේ

ජලය පානය කිරීමෙන් බරකත් ඇති බව පවසා අණ කිරීම සහ ඒ මගින් රෝගනිවාරණය පැතීම වැනි දුවහ සක් කරුණු නූතන ක්‍රියාවන් වේ. මුහම්මද් තුමාගේ කලණ මිතුරෙකු වන අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රළි) තුමා සමයේ එසේ කළ අය බලයෙන් වළක්වන ලදී. ඒ හා සම්බන්ධ සම්භවයක් මෙසේ සඳහන් වේ:

වරෙක අබ්දුල්ලාහ් බින් මස්ඌද් (රළි) තුමා දේවස්ථානයට ඇතුල් වන කළ එහි පිරිසක් ගල් කැට අනැතිව කවයක් ලෙස වාඩිවී, එහි කෙනෙකු මුලසුන ගෙන, වාඩි වී සිටි අනෙක් අය අමතා ඔබලාගේ අතේ ඇති ගල් කැට ප්‍රමාණයට තස්බීහ් කරන්න යනුවෙන් පවසනු අබ්දුල්ලාහ් බින් මස්ඌද් සවන් දුන්නේය. ඒ දෙස අප්‍රුල ලෙස බැලූ අබ් දුල්ලාහ් ඔබලා කරන්නේ කුමක්ද? එයට ඔවුන් අබූ අබ්දුර් රහ්මාන්, අප කරන දිකර්වල ප්‍රමාණය අප මේ ගල් කැටවලින් ගණනය කරමු යනුවෙන් කීවෝය. එයට අබ්දුල්ලාහ් 'ඔබලා ඔබලා කරන වැරදි ගැන සොයා බලන්න. මම ඔබලාගේ පින් විනාශ නොවන අයුරු බලා ගන්නම්' යනුවෙන් පවසා 'මුහම්මද් තුමාගේ ජනයිනි, මුහම්මද් තුමාගේ කලණ මිතුරන් ඔබ සමග තවමත් පසුවෙයි. මුහම්මද් තුමාගේ ඇඳුම් තවම දිරා ගොස් නැත. එතුමා භාවිතා කළ භාජන පවා තවමත් නොකැඩී පසුවෙයි. කරුණු එසේ වෙද්දී ඔබලා ඉක්මනින්ම විනාශයක් සොයා ගන්න උත්සාහ කරනවාද?' යනුවෙන් පවසා 'මාගේ ප්‍රානය කා අතෙහි වේදෝ ඔහු මත දිවුරා පවසමි, ඔබලා මුහම්මද් තුමාගේ දහමටත් වඩා හොඳ දහමක පසුවනවාද? එසේ නොවන්නට නොමග පසුවනවා දැයි පවසන්න' යනුවෙන් පැවසුවේය. (ධාරමි සහ තබරානි)

අබ්දුල්ලාහ් බින් මස්ඌද් තුමාගේ ඒ කියමන අපට මනා දැනුමුතුකමක් ලබා දෙන්නේය. මන්දයත් ඒ අය ක්‍රියා

කළ අයුරු කටයුතු කරන්නන් මුහම්මද් තුමා ගෙන හැර පා දහමට වඩා හොඳ දහමක විය යුතුයි. එසේ නොවන් නට මුහම්මද් තුමා නොදන්නා දෙයක් මොවුන් දැනගෙන ඒ අයුරු කටයුතු කරනවා විය යුතුයි. නොවන්නට මුහම්මද් තුමා නොමග පසුවෙයි යනුවෙන් තීරණය කළ යුතුව ඇත. අප පෙර සඳහන් කරුණු කිසිසේත් විය නොහැකිය. මන්දයත් මුහම්මද් තුමාට වඩා උතුම් පුද්ගලයෙක් සහ දහම ගැන මනාව දන්නා වෙනත් කෙනෙකු මිහිපිට සිටීමට නොහැකිය. එහෙයින් ඒය නොමග පසුවනවා මිස කුමට කියන්නද?

අර්රාෂිදා අෂ්ෂරීෆා යන වචනයට මවුන් අර්ථ කථනය කරන විට මවුන්ගේ කාලක්‍රියා කළ මුනිවරුන් සහ ෂෙයික්වරුන් මොවුන් එක්වී කරන දික්ර් උනන්දුවෙන් අවධානය කරමින් සිටී යනුවෙන් අදහස් කරගෙන ශාන් තදාන්තව කරන දික්ර් වලට වඩා අල්ලාහ් දෙවිඳු වන්දනා මාන කිරීමේදී පිළිපැදිය යුත්තේ වැදගත් පිළිවෙතකි. මුහම්මද් තුමා වරෙක මෙසේ වදාළහ : ඉහ්සාන් යනු ඔබ අල්ලාහ් දෙවිඳු නුදුටුවද ඔහු ඔබ දෙස බලාගෙන සිටී යන අදහසින් අවංකව වන්දනා මාන කිරීම වේ. (මුස්ලිම්) එහෙයින් ඉහත සඳහන් කළ මුහම්මද් තුමාගේ දෙසුම අප අල්ලාහ් දෙවිඳු වන්දනා මාන කිරීමේදී පමණක් ඒ අයුරෙන් ශාන්තදානතව කළ යුතුව ඇත යන්න මනාව වටහා ගැනීම වටී. නමුදු මේ පාර්ශවයේ අය අල්ලාහ් දෙවිඳුට කළ යුතු දික්ර් වැනි වන්දනාමාන කවදාදෝ මෙලොවෙන් මැරී ඉවත් වී ගිය මවුන්ගේ ෂෙයික්වරු වෙනුවෙන් කරන්න දරන උත්සාහය අපමණය. මවුන්ගේ ඒ ක්‍රියාව මගින් මවුන් අල්ලාහ් නොකළ යුතුයැයි අණ කළ ෂිර්ක් නම් පවක් කළ අය ලෙස පත්වන්නේය. අල්ලාහ් දෙවිඳු අල්කුර්ආනයේ

මෙසේ විස්තර කරයි: *'තවද සැබැවින්ම අල්ලාහ් පමණක් නැමදිව. ඔහුට කිසිවකින් සමානයක් නොතබව.* (4 : 36)

එහෙයින් දික්ර් නම් වන්දනාමානය වක්තා වරු ෂෙයික්වරු සහ මුනිවරුන්ට නොකර අල්ලාහ් දෙවිඳුට පම ණක් කළ යුතු වන්දනාමානයක් බව වටහා ගත යුතුව ඇත. එසේම එසේ දික්ර් කරන විට ඔවුන්ගේ නැසී ගිය මුනිවරුන් සහ ෂෙයික්වරුන් ඒ සභායට පැමිණෙනවා යන මතය චාදුලියා සහ සූෆියා වැනි තරීකා පිළිගන්නා අය තුලද ගැබ්වී ඇත.

එසේ දික්ර් කරන අවස්ථාවන්හීදී ඔවුන්ගේ ෂෙයික් වරුන්ගේ ප්‍රනාම සහ ගුණාගයන් පැවසෙන විට ඉතා උච්ච ස්වරයෙන් කෑ ගැසීමද අල්ලාහ් හැර ඔවුන් වෙතින් උදව් උපකාර පතා කන්නලව් කිරීමද ඉස්ලාම් දහම සහමුලින්ම තහනම් කළ පිළිවෙතක් වේ. එසේම අල්ලාහ් දෙවිඳු ස්තෝත්‍ර කරනවිට උච්ච ස්වරයෙන් ස්තෝත්‍ර කිරීම නුසුදුසු ක්‍රියාවක් බව මතු සඳහන් අල්කුර්ආන් වැකිය මනා ලෙස පැහැදිළි කරයි :

*විශ්වාස කරන්නන් කෙසේ අය නම් අල්ලාහ් සිහිපත් කළ විට ඔවුන්ගේ සිත තැති ගනු ඇත.* (8 : 2)

තවත් අවස්ථාවක මුහම්මද් තුමා මෙසේ දෙසූහ : මිනිසුනේ, ඔබලා ප්‍රාර්ථනා කරන විට ඔබලාට පමණක් ඇසෙන අයුරු ප්‍රාර්ථනා කරගනිව්. මන්දයත් ඔබලා අමතන්නේ ගොළුවෙකු හෝ ඔබලා වෙතින් ඉතා දුරස්ථව පසු වන්නෙක් නොවේ. ඔබලා අමතන්නේ ඔබට ඉතා සමීපව පසුවන ඔබ කොඳුරන දේ මනා අන්දමින් සවන් දෙන කෙනෙකුට වේ. (බුහාරි සහ මුස්ලිම්)

තවත් තැනක අල්ලාහ් දෙවිඳුගේ හිතවත් අය ගැන පවසන කළ බියබැතිකම අධික වී ඒ වෙනුවෙන් අඬා වැලපීම සහ කෑකෝ ගැසීමද අප්‍රිය සහගත ක්‍රියාවක් බව පැහැදිළිව සඳහන් කර ඇත. මන්දයත් එවැනි ක්‍රියාවන්හි නිරත වන්නේ අල්ලාහ් දෙවිඳුට ආදේශ කරන මුෂ්රිකීන් වරුන් බව පහත සඳහන් අල්කුර්ආන් වැකිය මනා ලෙස පැහැදිලි කරයි : *තවද අල්ලාහ්(ගේ නම)පමණක් (ඒකියයි) පවසනු ලද කළ පරලොව ගැන විශ්වාස නොකරන අයගේ සිත් ඇකිලීමට (සංවේගයට) පත් වන්නෝය. තවද ඔහු හැර අන් අය(ගේ නම්) ගැන බවසන කළ ඔවුහු ප්‍රමුදිත වන්නෝය* (39 : 45)

එවැනි තරීකාහී නායකයන් සහ ෂෙයික්වරු සීමාව ඉක්මවා ප්‍රශංසා කර ඔවුන් මිනිසුන්ගේ දුක්කරදර ඉවත් කරනු ඇත, ලෙඩරෝග සුව කරනු ඇත යනුවෙන් විශ්වාස කිරීම අල්ලාහ් දෙවිඳු ප්‍රතික්ෂේප කිරීම වේ. ලෙඩරෝග සුව කරන්නේ අල්ලාහ් දෙවිඳු පමණක් බව වක්තෘ ඉබ්රාහීම් තුමා තම හිමි අතමතා කළා යැයි පවසන වදනක් අල්කුර්ආනය මෙසේ සනිටුහන් කරයි :

*මා රෝගාතුරවූ කළ සුව කරන්නේ ඔහුය.* (26 : 80)

තවද මිනිසුන්ගේ ලෙඩරෝග සහ දුක්කරදර වැනි දේ ඉවත් කරන්නේ අල්ලාහ් බව මුහම්මද් තුමා මෙසේ සම්භාවයක් ගැන විස්තර කරයි : පෙර සමාජයක අල්ලාහ්ගෙන් පමණක් ප්‍රාර්ථනාකර තම උවමනාවන් ඉල්ලා සිටින ළමයෙකු ජීවත් විය. තම ලෙඩ සුව කරන පිණිස අල්ලාහ්ගෙන් ප්‍රාර්තනා කර ඉල්ලා සිටින ලෙස ඔහු වෙත එන අය වෙනුවෙන් ඔහු අල්ලාහ් දෙවිඳුගෙන් අවංකව ප්‍රාර්ථනා කර ඉල්ලා සිටින කළ ඔහුගේ ප්‍රාර්ථනාව අනුමත වී අල්ලාහ් ඔවුන්ගේ ලෙඩ සුව කළේය.

වරෙක ඒ සමාජයේ ලෙඩවූ ප්‍රභූවරයෙකු මුදල් පොදියක් පෙන්නා ඔබ මගේ ලෙඩ සුව කළා නම් ඔබට මේ මුදල් පොදිය දෙමි යි පවසා ඔහුගේ ලෙඩ සුව කර දෙන ලෙස ඉල්ලා සිටියේය. එවිට ඒ ළමය කිසිවෙකුගේ ලෙඩක් සුව කිරීමට මට ශක්තියක් නැත. ලෙඩ සුව කරන්නේ අල්ලාහ් දෙවිඳුය. එහෙයින් ඔබද අල්ලාහ් දෙවිඳු පිළි ගන්නේ නම් මා ඔබගේ ලෙඩ සුව වනු පිණිස අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්නම් යනුවෙන් පැවසීය. (මුස්ලිම්)

එසේ දික්ර්හි නිරත වන්නන් නිතරනිතර අල්ලාහ්ගේ නාමය උච්චාරනය කරති. ඔවුන්ගේ දික්ර් සහ විර්ද් එය වේ. නමුදු අල්ලාහ් යන වදන දික්ර් ලෙස මුහම්මද් තුමා හෝ එතුමාගේ කලණ මිතුරන් හෝ කිසිවිටෙයක පවසා නැත. එය මෙවන් සූෆිවරු විසින් සදාගත් ක්‍රමයකි. තවද අල්ලාහ් යනුවෙන් පවසන කළ එය වචනයක ආරම්භයක් මිස එය සම්පූර්ණ තේරුමක් අර්ථවත් වන්නේ නැත. එහෙයින් ඔවුන් ‘අල්ලාහ් අල්ලාහ්’ යනුවෙන් නොඩවා ආමන්ත්‍රණය කිරීම සම්පූර්ණ වචයක් නොපැව සුහ යන්න මනා ලෙස පැහැදිලි වේ. උදාහණයක් වශ යෙන් කෙනෙකු උමර් උමර් යනුවෙන් අමතනවා යැයි සිතමු. එවිට ඔහු ඒ හඬ ඇසී ඔබ උමර් අමතන්නේ ඇයි දැයි විමසුවද එයට පිළිවදන් නොදී නැවතනැවතත් උමර් උමර් යනුවෙන් ඇමතීම මුග්ධ ක්‍රියාවක් නොවන්නේද? එසේම මේ අයද කිසිදු සාධකයක් සඳහන් නොකර අල්ලාහ් අල්ලාහ් යනුවෙන් නනි වචනයක් ඇමතිම කුමට කියන්නද? මොවුන් එයට සාදක වශයෙන් අල්කුර්ආනයේ සමහර තැන්වල සඳහන් වන අල්ලාහ් යනුවෙන් පවසනු මැනවි යන වක්‍යයක සුළු කොටසක් ගෙන ඉදිරිපත් කරයි. නමුදු ඒ වක්‍ය කුමක් ගැන කියයිද යනුවෙන් මනාව

වටහා ගන්නට නම් ඒ වාක්‍ය සම්පූර්ණයෙන්ම කියවිය යුතු මනාය. එවන් වාක්‍යයක උදාහරණය 'නබි තුමනි ඔබ පවසනු මැනවි, අල්කුර්ආන් පහළ කළේ අල්ලාහ් යන්න වෙ. එහි 'පවසන්න අල්ලාහ්' යනුවෙන් පමණක් වූ වදන ගෙන ඔවුන් මෙසේ තර්ක කරති. මතු සඳහන් අල්කුර්ආන් වාක්‍යයේ පවසන අල්ලාහ් යන වචන දෙක අවසානව සඳහන් වන බැවින් ඔවුන් එසේ තර්ක කරතිග අල්කුර් ආනයේ ඒ වැකිය මෙසේය :

*මොවුන් යථාර්ථයෙන් ගෞරව කළ යුතු අයුරු අල්ලාහ් ගෞරව කළේ නැත. මන්දයත් (ඔවුන්) 'අල්ලාහ් කිසිවෙකු මත (දහමෙන්) කිසිවක් පහළ කළේ නැත' යනුවෙන් පවසති. ඔවුන් හට ඔබ පවසනු මැනවි 'කාන්තිය ගෙන දෙන්නා වූද මිනිසුන්ට යහමග පෙන්වන්නා වූද මූසා විසින් ගෙනෙන ලද ඒ පුස්තකය පහළ කළේ කවරෙක්ද? ඒවා ඔබලා කඩදාසිවලට පත්කර සමහරක් හෙළි කළහුය. බොහෝ දැය සඟවවහුය. ඔබලාද ඔබලාගේ පියවරුන්ද නොදන්නා දැය උගන්වනු ලැබුවහුය'. ඔවුහු තම නිරර්ථ (විවාද) යෙහි කෙළිලොලෙහි පසු වන්නට හැරව. (නබි තුමනි, නවද ඒවා පහළ කළේ) 'අල්ලාහ් යැයි පවසනු මැනවි'.* (6 : 91)

ෂාදුලියා තරීකා

වරෙක අප නිවසට පැමිණි හොඳ ගතිගුණයෙන් හෙබි ෂාදුලියා තරීකා කෙරෙහි ඇල්මක් දක්වන කෙනෙකු මුණ ගැසෙන්නට අවස්ථාවක් ලැබුණි. ඔහු සමග වූ මගේ මිත්‍රත්වය දියුණු වී ඔහු කෙරෙහි මට ඇති වූයේ ඉතා ප්‍රියජනක ඇල්මකි. ඔහුගේ නිවුණු ගතිය, සවන පිනන කතා විලාශය සහ ශික්ෂා සහගත හැසිරීම් මගේ හදනයන

පිනවන්නට විය. ඔහු සමග ඇති වූ ඒ තද බැඳීම නිසා ෂාදුලියා තරීක්කාහී දික්ර් සහ අනෙකුත් විර්දු උසුරීම් ගැන මට උගන්වන ලෙස ඉල්ලා සිටියෙමි. ඔහුද මගේ ඉල්ලීම පට ඒවා ඉගැන්වූ අතර මම හැකි ඉක්මනින් වනපොත් කර ගත්තෙමිග ඔහුට ෂාදුලියියා තරීක්කාවට සම්බන්ධ තරුණ පිරිසගෙන් හෙබි සභාවක් ඇති බවත් ඔහුන් සෑම සිකුරා දිනකම ජුම්ආ සලාතයෙන් පසු එක්රැස්ව දික්ර් වැඩසටහනක් ක්‍රියා කරන බවත් පසුව දැන ගන්නට හැකි විය.

වරෙක ඒ මහතාගේ නිවසට ගිය කළ එහි බිත්තියේ ෂාදුලියා තරීකාවේ පෙර නායකයන්ගේ, පූජකයන්ගේ ජායා රූප කීපයක එල්ලෙනු දුටු මම මෙසේ පිංතුර එල්ලා තැබීම නුසුදුයි, එසේ නිවෙස්වල පින්තුර වේ නම් මලාඉකාවරු නිවසට ඇතුල වන්නේ නැත යනුවෙන් බුහාරි සහ මුස්ලිම් හදීස් ග්‍රන්ථයේ සඳහන් වන හදීස් මතක් කර කියා සිටි යෙමි. එසේම නිවසක රූප තබා ගැනීමත්, ඒවා නෙලීමත් ඉස්ලාම් දහම තහනම් කර ඇති බවත් මතක් කළෙමි. එහි යථාර්ථය සහ තහනම ඔහු වටහා ගෙන සිටියද මගේ ප්‍රශ්ණයට පිළිතුරු නොදී ඔහු මුනිවත රැක්කේය.

නැවත වරක් උම්රා කටයුත්ත ඉටු කරන්නට අදහස් කරමින් මම මගේ පුතා සහ තවත් හිතවත් කීප දෙනෙක් සමග ඒ ගමනට සූදානම් වී සමුගනු වස් ඒ සත්ගුණවත් පුද්ගලයා මුණගැසීමට අදහස් කර ඔහුගේ නිවසට ගොස් ඔහු මුණගැසුනෙමු. ඔහු එදින රෑයේ ඔහු සමග භෝජනය සංග්‍රහයක් පවත්වන බවත් අති වාර්යයෙන්ම එයට සහභාගි වන ලෙසත් අපට පෙරැත්ත කළ හෙයින් අප එයට සහභාගි වුණෙමු. භෝජන සංග්‍රහය අවසන් වූ පසු ඒ සංග්‍රහයට

සහභාගි වූ ඔහුගේ අනෙකත් ගොලබාලයන් දෙස ඇඟිල්ල දික්කර මේ තරුණයන්ගෙන් ආගමික ගායනාවකට ඇහුම් කන් දෙන්න ඔබලා කැමැතිදැයි අපගෙන් විමසන්නට වූ අපද කැමැත්ත ප්‍රකාශ කර සිටියෙමු.

ඉතික්බිති ඔහු ගායනය කරන ලෙස එහි සිටි තරුණ යන්ට ඉඟියක් කළ විට ඔහුන් ගයන්නට පටන් ගත්හ. ඒ ගායනය මතු සඳහන් අන්දමින් අර්ථ නියෝජනය විය. *'ස්වර්ගය ප්‍රිය වීද නිරයේ අඬුවමට සහ අල්ලාහ්ට බිය වී තම කටයුත්තන් කරන්නේ කවරෙක්ද ඔහු පිළිම වන්දනා කරන්නෙකු මෙනි* ඒ ගායනාවේ අර්ථවත් වූ අදහස ගැන සැකයකට පත් වූ මම වහා ඔවුන්ගේ ගායනය අතරේම 'එසේ නම් අල්ලාහ් දෙවිඳු තම කීකරු අතවැසියන් වන වක්තෘ වරු ගැන අල්කුර්ආනයේ ප්‍රශංසා කරන්නේ මෙසේ නොවේද යනුවෙන් මතු සඳහන් අල්කුර්ආන් වැකිය ඔවුන්ට මතක් කළෙමි. *සැබැවින්ම ඔවුහු යහකම් (කිරීමෙ) හි කඩිනම් වන්නෝය. තවද ඔවුහු අපගේ (දයාව) බලාපො රොත්තු වෙන් සහ (අඬුවමට) බියෙන් ප්‍රාර්ථනා කරන් නෝය. තවද ඔහුවූ අපට බියසුළුද වූහ.* (21 : 90)

මා එසේ පැවසූ කළ දැන් ගායනා කළේ විද්වත් අබ්දුල් ගනි අල් නා'ලසිගේ ප්‍රසිධ ගායනයක් යනුවෙන් පවසා මගේ අවධානය වෙනත් අතකට යොමු කරන්නට උත්සාහ කළේය. අල්ලාහ් පැහැදිලිව මේ ගැන විස්තර කර තියෙද්දී ඒ අදහස ඉවත ලා ඔබගේ අදහස පිළි ගත් හැකිදැයි මම ඔහුගෙන් විමසුවෙමි. එයට එහි සිටි තරුණයෙක් 'අල්ලා හ්ගේ අනුග්‍රහය බලාපො රොත්තුවෙන් අල්ලාහ් දෙවිඳුට වන්දනාමාන කරන කෙනෙකු වානිජමය අදහසින් අල්ලාහ් දෙවිඳු වන්දනාමාන කරයි' යනුවෙන් අලිබින් අබීතාලිබ්

පවසා ඇත යනුවෙන් කියන්නට විය. එවැනි කරුණක් සඳහන් වන්නේ කිනම් ග්‍රන්ථ යකදැයි මම වහා විමසන් නට විමි. එයට ඔහු කිසිදු උත්තරයක් නොදී ගොළුවත රැක්කේය.

මුහම්මද් තුමාගේ කිට්ටුම සුමිතුරෙකු අලි බින් අබීතාලිබ් සැම විටම කටයුතු කළේ ස්වර්ගය කෙරෙහි ආශාව සහ එහි අනුග්‍රහය බලාපොරොත්තුවෙන් හෙයින් ඔහු කෙසේ එවැනි අදහසක් ඉදිරිපත් කරන්නදැයි විමසා අල්ලාහ් දෙවිඳු ස්වර්ග වැසියන්ගේ තත්ත්වය ගැන විස්තර කරන විට මෙසේ ප්‍රශංසනීය අන්දමින් පසසන බව මතු සඳහන් අල්කුර්ආන වැකිය පාරායනය කළෙමි. *ඔවුහු නම (ඉල) පැත්ත (නින්දෙන් නැගිට) සයනා සනයෙන් වෙන්ව බියෙන් හා අපේක්ෂාවෙන් ඔවුන්ගේ හිමිට යදිති.* (32 16)

මා ඒ අල්කුර්ආන් වැකිය පාරායනය කර එහි තේරුම පැහැදිලි කළද ඔවුන් එය පිළිගන්නට මැලි වූහ. අවස නායේ ඔවුන් සමග තර්ක කිරීම වැදගම්මට නැති දෙයක් බව වැටහී එතැනින් පිට වී ගියෙමි.

මා පසුපස කෙනෙකු වේගයෙන් දුවගෙන එන බව වැටහී යැමෙන් වහා ආපසු හැරී බැලුවෙමි. අප සමග සභාවේ සිටි කෙනෙකු වේගයෙන් මා මුණ ගැසීමට දුව ගෙන එනු දැක ගන්නට හැකි විය. ඔහු හති දමමින් මා වෙත පැමිණ ඔබ පැවසූ කරුණ හරියි. එහි ඉස්ලාම් දහමට කිසිසේත පටහැනි නැත. නමුදු අප ප්‍රධානියාට විරුද්ධව තර්ක කිරීමට තරම් ශක්තියක් හෝ ධෛර්ය යක් අපට නැත යනුවෙන් පවසන්නට විය. එසේ නම් සත්‍ය වැටහී යද්දී ප්‍රශ්ණ නොකර ඉන්නේ මන්දැයි විමසූ කළ

අප හරස් ප්‍රශ්ණ ඇසුවා නම් අප ඔහුගේ තෝවාසි කයෙන් පිටමං කරනු ඇත යනුවෙන් උත්තර දුන්නේය.

සූෆි වාදයේ යථාර්ථය එය වේ. එනම් නායකයා හෝ පූජකයා හෝ කුමක් කීවද එය වැරැදි හෝ නිවැරැදි හෝ වේවා ඒ ගැන ප්‍රශ්ණ කිරීමට හෝ ඔවුන් දරණ වැරැදි අදහස් උකහා දැක්වීමට හෝ කිසිවෙකුට අයිතියක් නැත. ඔවුන්ගේ අකරාදිය හැටියට පවසනවා නම් ප්‍රධානියාගේ වදනට ඇයි, කෙසේද යනුවෙන් ප්‍රශ්ණ කරන කිසිදු භක්තිකයෙක් ජය ලබන්නේ නැත යනුවෙන් පැවසේ. වක්තෘ මුහම්මද් තුමා දෙසන කළ ආදම් රුවන් සියල්ල වැරැදි කරන්නන්ය. ඔවුන් ගෙන් හොඳ පුද්ගලයා වන්නේ තමා කළ වරද පිළිගෙන පශ්චාත්තාප වී පවසමාව අයදින්නා වේ යනුවෙන් දෙසූහ. (අහ්මද් සහ තිර්මිදි) තවත් විද්වතෙකු වන මාලික් තුමා අදහස් දක්වන කළ මුහම්මද් තුමා හැර අන් අයගේ අදහස් පිළිගන්නත් හැකිය ප්‍රතිකෙෂ්ප කරන්නත් හැකිය යනුවෙන් අදහස් ඉදිරිපත් කළහ.

එහෙයින් කරිකා වාදීන් කරන දහමට පටහැනිවූ වැරැදි පෙන්වාදී ඔවුනට සත්‍ය පහදා දිය හැකිය යන්න අප සියළු දෙන මනාව වටහා ගත යුතුව මනාය.

නම් තුමා කෙරෙහි සලවාත්

සෑම සිකුරාදා දිනයකම ඔවුන් විසින් පවත්වනු ලබන හළුරා හෙවත් දික්ර් සන්ගානයනට සහභාගි වෑනු වස් මා මගේ තවත් යහළුවන් කීප දෙනෙකු සමග සහභාගි වූනෙමි. ඔවුන් වටවී එකිනෙකා අත අල්ලාගෙන නැවී හැරී උඩ පනිමින් තවත් විවිධ චලනයන් කරමින් 'අල්ලාහ් අල්ලාහ්' යනුවෙන් උච්ච ශබ්දයෙන් පවසමින් ගායනයක යෙදෙමින්

සිටියහ. ඔවුන් උනන්දු කරනු වස් විටින්විට සභාවේ අයෙකු ඉදිරියට පැන විවිධ ලෙස දිරිගැන්වීමේ සංඥාද කරන්නට වූහ. එහිදී එහි සහභාගි වී සිටි මගේ වාරය පැමිණි කළ මට ඉදිරියට පැමිණෙන ලෙස ප්‍රධානියා සංඥා කළේය. මා එයට එතරම් ප්‍රිය මනාපයනක් නොදැක් වූ හෙයින් අනෙක් කෙනාට සංඥා කළ අතර එහි ගායනාවේ වසීව් ගිය මා එයින් පිටනොවී අවසන් වන තුරු සිටියෙමි. එහි ගායනා කළ ගායනා සියල්ලම අල්ලාහ් හැර අන් අයගෙන් උප කාර පිටිවහල් පැතීම ගැන අර්ථ කථනය විය.

ඒ ගානයාව සහ සභාව දැකබලාගැනීමට පැමිණ සිටි කාන්තාවන්ද ඔවුන් පිරිමින් සිටිය තැනට විරුද්ධ පැත්තේ සිට උනන්දුවෙන් බලා ගෙන සිටින්නට වූහ. වහා ඔවුන් ගේ පැත්තට හැරුණු මගේ බැල්ම එහි මුහුණ අත්පා නිරා වරනව ඇඳුමක් ඇඳගන සිටි යුවතියක් කෙරෙහි පතිත විය. ඒ දර්ශනය මගේ සිත් නොගත්තද ඉවසීමෙන් මගේ බැල්ලම ඉවත් කරගෙන් සභාව අවසන් වූවායින් පසු ඒ දර්ශනය ගැන සභාවේ නායකයාගේ අවධානය යොමු කළ අතර මින්පසු මේ පල්ලියට පැමිණෙන කාන්තාවන් ඉස්ලාම් දහම පවසන අන්දමින් ඇඳුම් ඇඳගෙන පැමිණෙන ලෙස පැවසුවා නම් හොඳයි නේද යනුවෙන් ඉල්ලා සිටියෙමි. එයට ඔහු අප කිසිවිටෙක කාන්තාවන්ට උපදෙස් දෙන්න සූදානම් නැහැ යනුවෙන් ප්‍රතික්ෂේප කළේය. එසේම අප ඔවුන්ට උපදෙස් දුන්නා නම් ඔවුන් අප සභාවට සහභාගි වීමෙන් වැලකෙනු ඇතැයිද පැවසුවේය.

නමුදු සමාජයට යහමග පෙන්වන්නට නියෝජනය වූ වක්තෘ මුහම්මද් තුමා ඉස්ලාම් දහම හෙළා දකින මෙවන් සිරිත් විරිත් ගැන කරුණු පහදා දීම සෑම මුස්ලිම් වර

යෙකුගේම පරම යුතුකමක් යනුවෙන් වදාළහ. ඒ ගැන මුහම්මද් තුමා මෙසේ දෙසූහ : 'මබගෙන් කෙනෙකු අකට යුත්තක් දිටී නම් එය තම හස්තයෙන් වළකද්දෙන්. නොවන් නට එය තම දිවෙන් එනම් වචනයෙන් වළකද් දෙන්. නොවන්නට තම සිතෙන් එය අප්‍රිය කරද්දෙන්. එය ඊමා නයේ අවසානම කොටස එය වේ. (මුස්ලිම්)

ඉස්ලාම් පවසන දේ වෙතින් ඉවත් වී ඉස්ලාම් නොප වසන ව්‍යාජ දේ දහම යැයි කිරීම ගැන සිත කළ කිරී එතැතින් පිට වී ගියෙමි.

කාදිරියියා තරීකා

මට පාසැලේ ව්‍යාකරණය, අල්කුර්ආන් අර්ථ විවරණය වැනි දේ ඉගැන්වූ ගුරුතුමා හා වාඩිවී සමහර ආගමික කරුණු ගැන අදහස් හුවමාරු කරමින් පසුවන කළ එහි පැමිණි කාදිරියියා තරීකාහී විද්වතෙකු අප ඔහුගේ නිවසට කැඳවූයේය. එහි රෑ ආහාරය අවසන් කළ අප මද විවේක සුවයක පසුවන කළ පෙර දිනක මා දුටු අන්දමින්ම එහි සහභාගි වූ සමහරෙක් නටමින් ඇල වෙමින් පහත්වෙමින් 'අල්ලාහ් අල්ලාහ්' යනුවෙන් දික්ර්හී නිරත වන්නට වූහ. ඒ දික්ර් සභාවට සහභාගි වන ලෙස අපටද ඇරයුම් කළ හෙයින් අඩ සිතෙන් අපද සහභාගි වුනෙමු. නමුදු ඒ කටයුත්ත නොමනා දහමට පටහැනි එකක් බව සිත කී හෙයින් මද වේලාවකින් ඔහුන් ගෙන් සමුගෙන ඒ ස්ථානයෙන් පිටව ආවෙමි.

පසුදින ඒ සභාවට සහභාගි වූ කෙනෙකු මුණ ගැසුණු මම පසු දින රෑ ඒ නැටුම් සන්දර්ශනය අවසන් වූනේ කීයදටදැයි විමසූ කල මධ්‍යම රෑයේ දෙක වන තුරු

පැවැත්වුනු බව කීවේය. එසේනම් අළුයම ෆජ්ර් සලාතය කළේ කීයටදැයි විමසූ කළ ෆජ්ර් කරන්නට ප්‍රමාද වූනා යැයි කිසිදු දුකකින් තොරව කීවේය.

එක් අනිවාර්යය සලාතයක් අතපසු කරන්නට තරම් වූ ඒ දික්ර් සභාව වන්දනාමානයක්දැයි මා තුලම විමසා ගෙන ආයිෂා තුමිය සඳහන් කළ හදීසයක් ගැන මතක් කළෙමි 'පෙර රැයේම නින්දට ගොස් අවපසේම නැගිට සලාත් කරන පුරුද්දක් මුහම්මද් තුමා තමා සතු කරගෙන සිටියහ'. (බුහාරි සහ මුස්ලිම්) නමුදු මොවුන් රැයේ වෙසෙහට පත්ව මධ්‍යම පැයේ නින්දට ගොස් තම දෛනික සලාතය පවා අමතක කර අවපසේ තද නින්දට වැටෙති යනුවෙන් මා තුලම කියා ගතිමි. මෙසේ නොමනා ලෙස කටයුතු කරන්නන් ගැන අල්ලාහ් දෙව්දු අනතුරු අඟවමින් මෙසේ පවසයි :*තවද තම සලාත්හී නොසැළකිලිමත්ව සලාත් කරන්නන්ට විපතකි.* (107 4-5)
තවද ෆජ්ර් ෂලාතයේ වැදගත් කම ගැන පවසන කළ මුහම්මද තුමා මෙසේ දෙසූහ : 'ෆජ්ර් ෂලාතයේ රක්අත් දෙක ලොව සහ එහි ඇති දේවලට වඩා අගනේය'. (තිර්මිදි)

දික්ර් අවස්ථාවේ අප්පුඩි ගැසීම :

වරක් ජුම්ආ සලාතයට සහභාගි වනු වස් මා මගේ සුමිතුරෙකු සමඟ අසල ගමක දේවස්ථානයකට ගියේමි. එහි ගොස් ජුම්ආ සලාතය අවසන් කර පිටවන කළ එහි වරාන්තයේ දික්ර් සභාව ආරම්භ කර තිබුණි. ඒ දික්ර් සභාව උත්යොගිමත් වනු වස් කෙනෙකු එහි මැද සිටගෙන අප්පුඩි ගසමින් දික්ර් පසුවන්නන් උනන්දු කරමින් පසුවිය. එය දුටු මම එසේ අප්පුඩි ගැසීම නුසුදුසු බව

ඔහුට සංඥාවෙන් දන්වන්නට උත්සාහ කළෙමි. නමුදු මගේ අදහසට කිසිදු අවස්ථාවක් නොදී ඔහු තමා කරන දෙයම දිගටම කරගෙන ගියේය.

ඒ දික්ර් සභාව අවසන් වූ වහා එහි වැරැද්දක් ගැන වටහා දෙනු වස් එහි අප්පුඩි ගසමින් සිටි කෙනා මුණ ගැසී මුහම්මද් තුමාගේ සමයේ සහ එයට පෙර විසූ මිසදිටුවන් කඃබාව තුලද මේ අයුරු කටයුතු කළ බවත් අල්කුර්ආනය තුලින් අල්ලාහ් දෙවිඳු ඒ ගැන විස්තර කර ඇති බවත් ඔහුට පවසා ඒ අල්කුර්ආන් වැකිය ඔහුට මතක් කළෙමි. *ඒ දෙවස්ථානයේ ඔවුන්ගේ නැමදුම සියුරු හඬලීමද අත්පොළසන් දීමද මිස නැත.* (8 : 35)

ඒ අල්කුර්ආන වැකිය ගැන ඔහුට විස්තර කළ විට තම දික්ර් සභාවේ පෙර පූජකයෙකුගේ නමක් සඳහන් කර මෙවැනි සභාවේ අප්පුඩි ගැසීමට හැකි බව ඔහු පවසා ඇති බවත් තර්ක කරන්නට විය. ඔහුගේ උත්තරය ඇසූ මම තවත් අල්කුර්ආන් වැකියක් මතක් වී එය මොවුන්ට කෙතරම් සුදුසුදැයි මා තුලම කියා ගත්තෙමි.

*ඔවුන් අල්ලාහ් හැර තම පාදිරිවරුන් සහ රිෂිවරුන්ද දෙවියන් ලෙස පත් කර ගත්හ.* (9 : 31)

දිනක් මුහම්මද් තුමා මේ වැකිය පාරායනය කරනු සවන් දුන් එතුමගේ තවත් කලණ මිතුරෙකු වන පෙර කිතතුනු වෙකු වූ හාතිම් අත්තායි මුහම්මද් තුමා අමතා 'වක්තෘ තුමනි, අප අපගේ රිෂිවරුන් සහ පාරිදිරිවරුන් කිසිදාක වන්දනාමාන නොකළෙමු' යනුවෙන් කී කළ 'නැත, අල්ලාහ් හරාම් කළ දේ ඔවුන් අනුමත කළ විටද අල්ලාහ් අනුමත කළ දේ ඔවුන් හරාම් කළ විටද ඔබලා ඔවුන්ට

ඇහුම්කන් දී ඒ අනුව කටයුතු කළා නොවේද? එය තමා ඔවුන්ගේ වන්දනාමානය' යි මුහම්මද් තුමා විස්තර කරන්නට වූහ. (තිර්මිදි සහ බයිහකි)

එසේම තවත් වරෙක තවත් දේවස්ථානයක එසේ දික්ර් සභාවක සහභාගිවූ කෙනෙකු අමතා එසේ අප්පුඩි ගැසීම නුසුදුසු බව කී විට ගායනයවකට අප්පුඩි ගසන්නට උවමනා නොවේදයි කුතර්කව විමසන්නට විය. මබට වඩා උගතෙක් පවා අපගේ මේ ක්‍රියාව දැක කිසිවක් කීවේ නැහැ යනුවෙන් මහු මට සරදම් කරන්න්ට විය.

මෙවන් අය කරනදික්ර් සභාවලට සහභාගි වී එහි කට යුතු ගැන සොයා බලන විට දෙවිඳුගේ අල්ලාහ් යන සුද්ධ නාමය ආහ් හී හූ යාහූහ් යනුවෙන් වෙනස් කර දික්ර් යන නාමයෙන් සභා කත කරති. ඔවුන් මෙසේ අල්ලාහ්ගේ නාමය වෙනස් කර එහි අර්ථය විකෘති කිරීමට වූ අඩුවම සහ දරුණු ඵලවිපාකය මතුලොවේ විඳිනු ඇත යන්නට කිසිදු සැකයක් නැත.

විවිධ සෙල්ලම්

අප ගමට අසල ගමේ සූෆිවරුන් එක්රැස්වන ප්‍රධාන සභාවක් වේ. එහි ඔවුන්ගේ දික්ර් කෙසේ සිදුවනවාදැයි දැන ගැනීමේ ආශාවෙන් දිනක් එහි ගියේමි. ඒ දේව ස්ථානයේ ඉෂා සලාතය අවසන්වූ වහා සූෆි භක්තිකයන් එක්රොක්වී මහුන්ගේ සභා ප්‍රධානියා 'හාදි කාසා රාහ්, වස්කිනාල් අක්තාහ' යන ගායනය ආරම්භ කරන්නට අනෙක් අයද ඇදිපැදී නැලවී තාලයට එය ගයන්නට පටන් ගත්හ. ඒ ගායනයේ පටන් ගැන්ම 'මදු ගෙනැවිත් අපට වක්කර දෙන්න' යනුවෙන් වේ. සලාත් කර කුර්ආනය පාරායනය

කිරීම සහ බියබැතියෙන් අල්ලාහ් දෙවිඳු දික්ර් කරන්නට තනා ඇති දේවස්ථානයේ කිසිඳු බියකින් තොරව මත්ද්‍රව්‍ය ගැන ගයන්නට පටන් ගැනීම අපූරු සහගත විය. තමුදු මත්ද්‍රව්‍ය හරාම් බව අල්ලාහ් අල්කුර්ආනයේ සහ මුහම්මද් තුමා තම හදීස් සංකල්පය තුලින්ද අනතුරු අඟවා ඇති බව නොදන්නා මුස්ලිම් වරයෙකු මේ මිහිපිටම නැත.

පසුව රබාන් සහ වැනි දේ වාදනය කරමින් එහි කෙනෙකු මැදට පැමිණ උජ්ජ ස්වරයෙන් 'යා ජද්දාහ්' යනුවෙන් කෑ ගසන්නට විය. එය රිෆායි තරීක්කාහී පෙර දිනක මිය ගිය නායකයෙකුගේ අභය සහ උදව්ව පතනවා යනුවෙන් වටහා ගන්නට හැකි විය. විශේෂයෙන් රිෆායි තරීක්කාහී භක්තිකයන් මෙවැනි අන්දමින් උදව්පදව් පතා සභාවන් පැවැත්වීම සාමණ්‍ය සිරිතක් බවට පත් කර ගෙන සිටියහ. පසුව මුවහත් අසිපතක් ගෙන 'යාජද්දාහ් යා ජද්දාහ්' යන වෙන් කෑ ගසමින් තම බටඩ එයින් අනින්නට විය.

එය අවසන් කර මොහොත් කීපයකට පසු හමුදාවේ සේවය කරන තිලයක් දරන කෙනෙකු පැමිණ ජලය පානය කරන්නට අසල තබා ඇති තිබුණු කණ්ණාඩි භාජනයක් ගෙන එය තම මුව තුලට කිට්ටු කර සපා ගන්නට පටන් ගත්තේය. මොහුගේ මේ හාස්කම් යම් ඇස්බන්ධනයකින් තොරව නම් හමුදාවට සම්බන්ධ වී සිටින මෙහු අහිංසක මුස්ලිම් ජනතාව ඝාතනය කරන යුදෙව්වන් විනාශ කිරීම පිණිස තම හාස්කම පාවිච්චි නොකරන්නේ මන්දැයි මම මා තුලම විමසා ගත්තෙමි.

වසර 1987 දී යුදෙව්වන්ට සහ මුස්ලිම්වරු ඇතිවූ මහා යුද්ධයේදී යුදෙව්වන් අරාබි වරුන් පරදවා ඔවුන්ට කළ විනාශය නිම්හිම් නැති තරම්ය. එසේම කණ්ණාඩි භාජනය

සපා කෑ හමුදා නායකයාද ඒ මුස්ලිම් හමුදාව නියෝජනය කරන කෙනෙකි. නමුදු යුද්ධයේදී පසුබට වී ආපසු පැමිණියා මිස ඔහු කළ හාස්කමක් නැත.

වැදගත් කරුණු :

රිෆායි තරීක්කාව නියෝජනය කරන්නන් තම දේහය කඩු කිනිසිවලින් ඇනකොටා ගන්නා කරුණ අපගෙන් සමහ රෙක් එය හාස්කමක් ලෙස නාමාධාරී කරන්නට සූදානම් වෙයි. නමුදු එහි කිසිදු සත්‍යයක් නැත. මොවුන් නොමග යවනු වස් ෂයිතාන්වරු මොවුන්ට මෙවන් කට යුත්තන්හී නිරත වන්නට පිටි වහල් වෙයි. මන්දයත් මොවුන් මොවුන්ගේ පූජකයන් සහ නායකයින් අමතමින් උදව් පතන කළ මොහු සත්‍ය දෙවිඳු අල්ලාහ් ප්‍රතික්ෂේප කර ෂයිතාන්ට යටත් වූ බව සක්සුදක්සේ පැහැදිලිය. මෙසේ නොමග යන්නන් හට ෂයිතාන්ද තමාට හැකි අයුරෙන් ඔවුන් තවතවත් නොමග යවන්නට වෙර දරන්නේය. එසේ අල්ලාහ් දෙවිඳු අත්හැර ෂයිතාන්ගේ උදව්ව බලාපොරොත්තු වන්නේ කවරෙක්ද ඔහු තවතවත් ඒ නොමගෙහිම යන බව අල්ලාහ් දෙවිඳු අල්කුර්ආනයේ මෙසේ විස්තර කරයි :

*යමෙක් පරමදයාළුහු මතක් කිරීමෙන් ඈස්වසා ගනීදෝ, අපි ඔහුට ෂයිතාන් වරෙයකු (සගයෙකු ලෙස) නියම කරන් නෙමු. ඔහු ඔහුට සගයෙකු වන්නේය. ඇත්තෙන්ම (ෂයිතාන් වන) ඔවුන් ඔවුහු (අල්ලාහ්ගේ) ඍජුමගෙන් (දුමගට) වෙන අතකට හරවන්නෝය. නමුදු තමන් යහමග ලද්දෝ යයි ඔවුන් සිතන්නෝය.* (43 : 36-37)

මොවුන් අල්ලාහ්ගෙන් අයැදිය යුතු පිටිවහල අන් අය ගෙන් ඉල්ලා සිටින කළ මොවුන් කෙරෙහි අල්ලාහ් දෙවිඳු

උරණ වෙයි. දැනදැනම ඔවුන් එසේ අල්ලාහ් හැර අන් අයගෙන් උදව් උපකාර පතන කළ අල්ලාහ් දෙවිඳු ඔවුන් තවතවත් නොමග යවන්නේය. ඔවුන් එසේ නොමග යවන්නට ඔවුන්ගේ ආයුෂ කාලයද දීර්ඝ කර දෙන බව අල්ලාහ් දෙවිඳුම අල්කුර්ආනය තුලින් පවසයි :

*නොමගෙහි පසුවන්නේ කවරෙක්ද දයාළු වන්තයා ඔහුට කාලය දික්කිරීමක් කරන්නේයයි පවසව.* (19 : 75)

මේ විලසින් මොවුන් තමන් කපා කොටා ගන්නට ෂයිතාන් උදව් කරනවා යන්නට කිසිදු සැකයක් නැත. මන්දයත් ෂයිතාන් තුවචමනා දේ කර අල්ලාහ්ගේ මාර්ගයෙන් මිනිසා නොමග යැවීමට සෑම උත්සාහයක්ම දරන්නේය. එසේම වක්තෘ සුලෙයිමාන් තුමා තම සේනාව ෂිබා රට වෙත යොමු කළ විට එයට පෙර ඒ රටේ රැජිනගේ සිංහාසනය රැගෙන එන්න යමෙකු සිටීදැයි වක්තෘ සුලෙයිමාන් තුමා විමසූ කළ ඉෆ්රීත් නම් ජින් එයට පිළිවදන් දුන් බව අල්කුර්ආනය මෙසේ පවසයි :

*ජින්වරුන්ගෙන් (ශක්තිමත් කෙනෙකු වන) ඉෆ්රීත් 'ඔබ හුන් තැනින් නැගිටින්නට පෙර එය මම ඔබ වෙත ගෙන එන්නෙමි' යි කීවේය.* (27 : 39)

එසේම ඉන්දියාවේ වෙසෙන අග්නිපූජකයන් හාස්කම් හා සමාන විෂ්මජනය දේ කර පෙන්වනු තම සියැසෙන් දුටු බව ඉන්දියාවේ සංචාරයක යෙදුනු ඉබ්නු බතූතා තම ග්‍රන්ථයේ සඳහන් කරයි.

මෙසේ යකඩෙන් ඇනගැනීමද කඩුවෙන් කොටා ගැනීමද පිහියෙන් කපා ගැනීමද අල්ලාහ් දෙවිඳු විසින් මොවුන්ට දුන් හාස්කමක් හෝ විස්කමක් හෝ නොවේ. මෙය ගැයුම්

වැඳුම් පවත්වන තැන්වල ෂයිතාන් විසින් කරන මාය ක්‍රියාවන් වේ. එසේම මෙවන් කටයුතුවල නිරත වන්නන් දෙස අවධානයක් කර බලන්නේ නම් ඔවුන් අල්ලාහ් විසින් අනුමත නොකරන ලද බෙහෝ දේ කර ප්‍රසිද්ධ නොමගේ පදුවනු දැකිය හැකිය. මෙසේ අල්ලාහ්ට මහුගේ වක්තෘ තුමාගේ අණපනත් සහ ඔවදන් වලට පටහැනිව ක්‍රියා කරන්නන් කෙසේ අව්ලියාවරු, අල්ලාහ්ගේ කීකරු අනවැසියන් යනුවෙන් පවසන්නද? අල්ලාහ්ගේ සත්‍ය කීකරු අනවැසියන් ගැන මෙසේ පවසයි :

*(විශ්වාස වන්තයිනි) දැනගනිව. අල්ලාහ්ගේ සහායයන්ට කිසිදු බියක් නැත. ඔවුහු ළතවෙන්නෝද නැත. ඔවුහු විශ්වාස කර සිරිත්විරිත් රැක්කවුන්ය.* (10 : 62-63)

එහෙයින් අල්ලාහ්ට සහමුලින්ම කීකරු වන සත්‍ය අනවැසියන් අල්ලාහ්ට ආදේශ කිරීම සහ පව් වැනි සියළු කට යුතු වලින් ඉවත්වී සෑම මොහොතකම අල්ලාහ්ගෙන් පම ණක් පිටිවහල් පතන කෙනෙකු ලෙස කටයුතු කරන් නෝය. මෙවන් අල්ලාහ්ගේ සත්‍ය අනවැසියන්ට අල්ලාහ් දෙවිඳු විසින් මහුට නොදැනු වත්වම සමහර හාස්කම් සහ විස්කම් ලබා දෙන්නේය.

ඉස්ලාමිය විද්වතෙකු වන ඉබ්නු තයිමියා තම ග්‍රන්ථයක සඳහන් කරන විට අල්ලාහ්ගේ සත්‍ය අනවැසියන් වන මෙවන් හාස්කම් ලබන්නන් අල්කුර්ආනය පාරායනය කර නවිට හෝ වන්දනාමානයෙහි නිරත වන කළ හෝ මෙවන් නොමනා සිදුවීම් නොසිදුවන බව විස්තර කරයි. මන්දයත් එවන් වන්දනාමානයන් දහම අනුමත කළ ෂයිතාන් වැනි නපුරන් පලවා හරින වන්දනාමානයන් බැවිනි. නමුදු මෙවන් තරීකා වාදීන් සහභාගි වන දික්ර් සභා වැනි

කටයුතු ෂයිතාන් අමතන, අල්ලාහ්ට ආදේශ කිරීම් වැනි පව මිශ්‍ර ඉස්ලාම් දහම තුලට නූතනයේ ඇතුලත් කරන ලද නූතන ක්‍රියාවන් යන්න අන් අදහසක් නැත.

මෙවන් ඉස්ලාම් දහම අනුමත නොකරන නූතන ක්‍රියාවන් හෙළා දකින සත්‍ය විශ්වාස වන්තයෙකු මෙසේ කඩුවෙන් පිහියෙන් කපා කොටා ගන්නා කෙනෙකු මුණ ගැසී හැකිනම් කටුවකින් තම ඇස්වලට ඇන ගන්නා ලෙස ඉල්ලා ඇත. එවිට බියට පත්ව තමාට එවැන්නක් කරන්නට බැරියයි ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. මෙයින් වැටහෙන්නේ ඔවුන්ටම කියා ඇති සමහර ආයුධ වලින් ඔවුන් මෙවැනි නොමනා කටයුත්තන්හී නිරත වන බවය. තවද මෙවන් ක්‍රියාවන්හී යෙදී සිට පසුව ඒවා වැරැදි බව වටහා ගෙන එයින් මිදී පව සමා අයැද නිසිම ගට යොමු වූ අය පවා තමන් එදා කළ කටයුත්තන් සහ හැලූ රුධිරය ගැන තම මිතුරන් හා පුරසාරම් දෙඩීම කුමට කියන්නද?

වරෙක හමුදාවේ සේවය කරන සේවකයෙක් තමා ලග තිබුණු ආයුධයකින් තම ඇඟට ඇනගෙන රුධිරය වහනය වනු දුටු තවත් කෙනෙකු ඔහු අමතා ඔබ කළ දේ නිසා ඔබට කිසිදු වේදනාවක් නොකාදැනුනේ නම් මේ ආයුධ යෙන් මම ඔබගේ කකුලට පහරක දෙන්නම් ඉවසා ගනු යනුවෙන් කියා පහරක් දුන් කළ වේදනාව ඉවසා ගන්නට බැරිව කෑ ගසමින් උදව් ඉල්ලා අන් අයට අමතන්නට විය. එවිට එහි සිටි තවත් සමහරු ඔහුගේ පෙර ක්‍රියාවන් මතක් කරමින් ඔහුට නොසෑහෙන්න විහිළු කරන්නට වූහ.

කෙටි සටහනක්

කඩුපිහි සහ තවත් සමහර ආයුධවලින් ඇනකොටා ගැනීම මුහම්මද් තුමා හෝ ඔහුගේ සුමිතුරන් හෝ තාබිඊන්වරු හෝ අනෙකුත් ආගමික ලබ්ධිකයන් හෝ කිසිදාක නොකළ කටයුත්තකි. මෙවන් කටයුතු ඉස්ලාම් දහම අනුමත කර ඇත්නම් ඒවා එදා මුහම්මද් තුමා, එතුමාගේ කළණමිතුරන් සහ අනෙකුත් සත්‍ය ඉස්ලාමීය ලබ්ධිකයන් ආදර්ශමත් ලෙස කර පෙන්වා දිය යුතුය. එහෙයින් ඒ අය එවන් නූතන ක්‍රියාවන් කර නොපෙන් වූ හෙයින් ඒවා ෂයිතාන්ට වහල්වී අල්ලාහ්ට ආදේශ කරමින් ඉස්ලාම් දහමේ වන්දනාමානයක් යනුවෙන් උකහා දක්වන්නට වෙර දරන නූතන ක්‍රියාවක් යන්න සුපැහැදිලිය.

මෙසේ ඉස්ලාම් දහම තුලට නූතනව අනුමත කරන්නට උත්සාහ දරන ක්‍රියාවන් හෙළා දකිමින් මුහම්මද් තුමා මෙසේ වදාළහ : (ආගම තුලට) නූතනව තනා ගෙනෙන ලද දේ ගැන මම ඔබටලාට අවවාද කරමි. මන්දයත් නූතනව තනන ලද සියල්ල බිත්අත් හෙවත් දහම තුලට ගෙන එනු ලබන අනුමත නොකරන නවීන ක්‍රියාවන් වේ. සියළු බිත්අත් නොමග යැවීම් වේ. සියළු නොමග යැවීම් නිරයට සේන්දු වනු ඇත. (නසඊ) එසේම මොවුන් ආගම් මුආවෙන් කරන මෙවන් කටයුත්තන් කිසිසේත් ඉස්ලාම් දහම අනුමත නොකරන බව මුහම්මද් තුමා වරෙක මෙසේ අනතුරු ඇඟවූහ. 'ඉස්ලාමිහී නැති දෙයක් ඉස්ලාමිහී ඇත බව පවසමින් කරයිදෝ එය ඉස්ලාමය කිසිසේත් අනුමත නොකරනු ඇත'. (මුස්ලිම්)

අප පෙර සඳහන් කළ ඒ නොමග ගියවුන් ෂයිතාන් වරුන් සහ මලගිය ඇත්තන් අමතා විලාප නැග උදව්

උපකාර ඉල්ලා සිටිනු සාමාන්‍ය සන්සිද්ධියක් බවට පත්ව ඇත. මෙසේ අඩා වැලපී අල්ලාහ් හැර අල්ලහ් විසින් නිර්මාණය කරන ලද අය වෙතින් උදව් පැතීම ඉස්ලාම් කිසිසේත් අනුමත නොකරයි. එය ෂිර්ක් හෙවත් විශාල ආදේශ කිරීමක් බව අල්ලාහ් දෙව්දූම අනතුරු අඟවයි :

*ඇත්තෙන්ම යමෙක් අල්ලාහ්ට සමානයක් තබන්නේද අල්ලාහ් ඔහුට ජන්නාව තහනම් කළේය. තවද ඔහු අයින් වන තැන (නිරයේ) ගින්න වේ. වරද කරන අයට උදව් කරන්නන්ගෙන් (කිසිවෙක්) නැත.* (5 : 72)

ෂිර්ක්හී නිරත වෙමින් මරණයට පත්වන්නන්ට කිසිසේත් ගැලවීමක් නැත. ඒ ගැන අනතුරු අඟවා මුහම්මද් තුමා මෙසේ වදාළහ : අල්ලාහ් හැර පිළිම වන්දනාමාන කරමින් පසුව මරණයට පත්වන්නා නිරයට යනු ඇත'. (බුහාරි) තවද ඔවුන් කරන ඒ වන්දනාමනයන් ඇමතීම් හරි යනුවෙන් අනුමත කරන්නන්ද, ඒ කටයුතුවලට ඔවුන් හා එක්වී ඔවුන්ට පිටිවහල් වන්නන්ද එසේ ආදෙශ කරන්නන් ලෙෂ සැළකෙයි.

මවලවියාතරීක්කා

මවලවියා තරීකාව නියෝජනය කරන්නන් හට අප ගමේ විශාල මස්ජිදයක්ම වේ. ඔවුන්ගෙන් නිගමනය අනුව අල්කුර්ආන් වැකි සහ තවත් කියමන්වලින් සරසා ඔවුන්ගේ තරීකාවෙ නැසීගිය නායකයන්ගේ මුනිවරුන්ගේ යැයි සළකණ සොහොන් එහි වටා අනන්ත අප්‍රමාණව ඇත. ඔවුන් සැම සිකුරාදා දිනයම හෝ ඔවුන්ගේ යැයි සැළකෙන සමහර විශේෂ දිනයන්හි ගැයුම් වැයුම් සහිත හාළරා නම් දික්ර් කටයුත්තන්හී නිතර වෙති. එසේ දික්ර් කරගෙන යන විට

එහි කෙනෙකු මැදට වී වටේ කැරකෙමින් සියළු දෙනා අවධානය කරමින් පසුවනු ඇත. තවද ඔවුන්ගේ ප්‍රධානි යෙකු වන ජලාලුද්දීන් රූමි වෙතින් හෝ අන් නායක යින්ගෙන් හෝ උදව් පතන විට පුණ්‍ය කර්මයක් සහ අනුග්‍රහය පතා හිසට හොන්නා නම් වර්ගයේ ගස්වල කොළවලින් තනා ගන්නා සායම් ගා ගන්නා පුරුද්දක් ඔවුන් අතර වේ.

අල්ලාහ් පමණක් නමදින්නට තනා ඇති මස්ජිද්වල යුදෙව් වන් සහ කිතුනුවන් සේ නැසිගිය පුද්ගලයන් භූමදාන කරන පුරුද්දක් කරගෙන ඇත. මේ පුරුද්ද බොහෝ මුස්ලිම් වරුන්ද කරගෙන යෑම අවාසනාවන්ත සිද්ධියකි. ඒ ගැන අවවාද කර මුහම්මද් තුමා මෙසේ වදාළහ : 'නම වක්තෘ වරුන්ගේ දිව්‍යප්‍රසාදිවරුන්ගේ සොහොන් වන්දනාමාන ස්ථානයන් ලෙස පත් කරගත් යුදෙව්වන්ට සහ කිතුනු වන්ට අල්ලාහ්ගේ ශාපය ඇති වේවා'. (බුහාරි)

තවද, එවන් පුදගලයින්ගේ මිනිවල දෙසට මුහුණ ලා වන්දනාමන කිරීම හෝ සලාත් කිරීම ගැන පවසන කළ මුහම්මද් තුමා මෙසේ දෙසූහ : 'ඔබලා මිනිවල මත ඉඳ ගන්න එපා. ඒ දිසාවට මුහුණ ලා වන්දනාමාන කරන්න එපා' (මුස්ලිම් සහ අහ්මද්). තවද මිනිවලවල් උස්කර බැඳීමද, ඒ මත විවිධ මාදිලියේ හැට බැමි සහ තාප්ප බැඳීමද, ඒ මත විවිධ මාදිලියේ වචන ලිවීමද, එහි තෙල් ආලේප කිරීම වැනි කටයුතු කිරීම වැනි සියළු කටයුතුද තහනම් යන්න වටහා ගත යුතුය. මුහම්මද් තුමාගේ ඔවදන අනුව ඒවැනි සියළු කටයුතු තහනමය. තවත් මුහම්මද් තුමාගේ කියමනක 'මිනිවලවල්ට හුණු ගැමද එය උස්කර කර බැඳීමද තහනම් කරයි (මුස්ලිම්). තවත්

කියමනක මිතිවල මත කිසිවක් ලියන්න එපා යනුවෙයන්ද සඳහන් වෙ. (හාකිම්)

මස්ජිදය තුල දික්ර් කරන විට සංගීතය හෝ අනෙකුත් ශබ්ද නගන භාණ්ඩ පාවිච්චි කිරීමද සූෆි වරුන් විසින් හඳුන්වා දෙන ලද නූතන පුරුද්දකි. නමුදු ඉස්ලාම් දහම සංගීතය සම්පූර්ණයෙන්ම තහනම කර ඇත. නමුදු මේ නවීන වාදීන් ඉස්ලාම් දහම තහනම් කර ඇති සංගීතය දේවස්ථානය තුල අනුමත කර තිබීම ඉතා දුක්ඛිත සන්සිද්ධියක් ලෙස විදහා දැක්විය හැකිය. මුහම්මද් තුමා මෙසේ දෙසූහ : 'පසු කාලයේ මගේ සමාජයේ දුරාචාරයද, පටද, මත්ද්‍රව්‍යයද, සංගීතයද සුදුසුයැයි කියන කොටසක් බිහි වනු ඇත'. (බුහාරි සහ අබුදාවුද්) නමුදු අවුරුදු දින යන්හීද මංගල දිනයකදීද ඒ වෙනුවෙන් දැනුම් දෙනුවස් රබන් ගැසීම සංගීතය යනුවෙන් අර්ථ කථනය කළ නොහැකිය.

තවද මොවුන් සංගීතය සමග කරන මෙවන් දික්ර් සහ ඉස්ලාම් අනුමත නොකළ එවන් වැඩසටහන් අන් මුස්ලිම් වරුන්ද ඇහුම්කන් දිය යුතුය දැක බලා සතුටු විය යුතුය යනුවෙන් තමාට හැකි අයුරෙන් අන් මස්ජිද්වලටද ගොස් පවත්වන්නට දරණ උත්සාහය අති මහත්ය.

මේ දික්ර් සභාවල්වලට සහභාගි වන කෙනෙකු වරෙක තම පුතාට ඉස්ලාම් දහම අනුමත නොකරන කාෆිර්වරුන් අඳින ඇඳුමක් අඳින්නට සැළසුවේය. ඒ ඇඳුම වෙනුවෙන් තවත් ඇඳුමක් දී මහු නැති අවස්ථාවක ඒ ඇඳුම ඉරා දමන්නට අවස්ථාවක ලැබූ කළ මම එය ඉරා දැමූවෙමි. එයට උරණ වූ මහු මා ඒ ඇඳුම කෙරෙහි වූ ඊර්ෂ්‍යාව නිසා එසේ කළ බව රාවයක් පැතිරූ නිසා මම මහු මුණගැසී මා එසේ

කළේ ඉස්ලාම් දහම අනුමත නොකරන කාෆිර්වරුන්ගේ ඇඳුමක් ඔහු ඇඳගෙන සිටි නිසා බව ඔහුට කරුණු පැහැදිලි කර ඔහුගෙන් ඒ වෙනුවෙන් සමාව ඉල්ලුවෙමි.

මා ඔහුගේ සේවාස්ථානයට ගිය විට ඔහු වාඩිවී සිටි අසුනට ඉහළින් යා හද්රත් මව්ලානා ජලාලුද්දීන් යනු වෙන් ලස්සන ලියා තිබුණු පුවරුවක් දැක ගන්නට හැකි විය. ඒ පුවරුව පෙන්වා තමන් අමතන විට පිළිවදන් දිය නොහැකි මරණයට පත්ව කවදාදෝ මිහිදන් කළ කෙනෙකු උදව් පතා අමතන්නේ මන්දැයි මම ඔහුගෙන් විමසුවෙමි. ඔහු ඇසූ නැසූ තරමට මගේ ප්‍රශ්ණයට උත්තර නොදී තම වැඩ කටයුතුවල නිරත විය. මෙවැනි අයට යථාර්ථය පවසන්නේ කෙසේද යනුවෙන් කල්පනා කරමින් මමද ඒ කාර්යාලයෙන් පිටවී ගියෙමි.

මුග්ධ කම

වරෙක සූෆිවරුන් විසින් පවත්වන ලද දේශයකට මමද සහභාගි වුනෙමි. ඒ දේශනයට ගුරුවරුන්, තවත් විවිධ ක්ෂේත්‍රවල විද්වතුන් සහ තවත් බොහෝ උගතුන්ද පැමිණ සිටියහ. එදින දේශනයේ මාතෘකාව වූයේ අල්හිකම් ලිබ්නි අජීබා නම් පොතෙන් උපුටා ගන්නා ලද 'සූෆිවරු කෙසේ තමන් ඒ වෙනුවෙන් සූදානම් කර ගන්නවාද?' යන්නයි. ඒ දේශන මණ්ඩපයේ වැදගත් කෙනෙකු ඒ පොතෙන් කරුණු දෙකක් ගෙන කියවන්නට විය. ඔබද එය දැන ගනු වස් මම එය මෙහි උපුටා දක්වන්නට අදහස් කරමි.

තමා සොරෙක් බව මිනිසුන් අතර ප්‍රසිද්ධියට පත් වූ හෙයින් එයින් වැළකී පිරිසිදු විය යුතුය යනුවෙන් තීරණය කළ කෙනෙකු නගරයේ ප්‍රසිද්ධ නාන කුටියකට ඇතුල් විය.

නෑ අවසන් වීමෙන් පසු ඇඟ පිසදා ගන්න දෙන රෙදිකඩ ගෙන අනුන්ට පෙනෙණ විලසින් සඟවා ගන්නා අයුරු තබා ගත්තේය. ඔහු බලාපොරොත්තු වූ අන්දමින්ම ඒ නාන කුටියේ මුරකරුවා ඔහු එහි රෙදි කඩක් සොරකම් කරගෙන යන බව සිතා ඔහු අල්ලා බැන වදින්නට පටන් ගත්තේය. ඒ අසලින් ගමන් කළ අයද ඒසූෆි පුද්ගලයා බැනුම් අසන කාරණය අසා දැනගෙන ඔවුන්ද ඔහුට බැන වදින්නට වූ අතර ඔහු ගැන වැරදි අවබෝධයක් ඇති කරගෙන එතැන්න් නික්ම ගියහාග ඒ සම්භවය මගින් ඔහු තමා යහ මගට හරවා ගත්තායයි නාම සිත් තුළම සතුටු වන්නට විය යනුවෙන් ඒ සම්භවය අවසන් කළේය.

දෙවැනි සම්භවය : තමා යහමගට හරවා ගන්න අදිටන් කරගත කෙනෙකු මල්ලක් පුරා එලතුරුවලින් පුරවා ගෙන කඩවීදිය දෙසට ගමන් කළේය. කඩවීදියේ කුඩා ළමුන් දකින විට ඔබ මගේ මුහුණට කෙළ ගසන්නේ නම් මම ඔබට එලතුරක් දෙමි යනුවෙන් කියා ළමුන් ගෙන් ඉල්ලා සිටී කළ ළමුන් කෙළ ගැසීමෙන් පසු ඔවුන්ට එලතුරද දුන්නේය. එලතුරු කෙරෙහි ප්‍රිය වූ ළමයින්ද ඔහුගේ මුහුණට කෙළ ගසන්නට වූ අතර ඔහුද ඔවුන්ට එලතුරු වලින් සංග්‍රහ කළේය. ඒ සූෆි වරයා ළමුන්ගේ ඒ ක්‍රියා වෙන් මහත් සතුටට පත්විය යනුවෙන් දෙවැනි සම්භවයද කියවා අවසන් කළේය.

මේ සම්භවයන් දෙක කියවනු අසා සිටීමට ඇතිවූ කෝපය නිම්හිම් නැත. නමුදු සභාවක් නිසා මගේ කෝපය හැකි අයුරෙන් මැඩ පවත්වා ගත්තෙමි. ඉස්ලාම් මිනිසා සම්භා වණයට පත් කරද්දී තමන් පිරිසිදු කරගන්නවා යනුවෙන් මොවුන් දෙන්නා කරන්නේ මිනිස් සම්භවයටම නිගාවක්

යැයි මා සිත තුල සංවේගයක් ඇති විය. නමුදු අල්ලාහ් දෙවිඳු මිනිස් සමාජය සම්භාව ණයට පත් කළ ආකාරය ගැන පවසන කළ කොපමණ උසස් අන්දමින් පවසනවා දැයි ඒ ගැන මෙනෙහි කළෙමි: *සැබැවින්ම අප ආදම්ගේ දරුවන් සම්භාවණීය කළෙමු. අප ඔවුන් ගොඩෙහිද සමුද්‍රයෙහිද උසුලා ගෙන යන්නෙමු. අප (හොඳ දැයින්) ඔවුන්ට බොජුන්ද දුනිමු.* (17 : 70)

ඒ දේශනා මාලාව අවසන්වූ වහා 'මබලා සිත් එක්ලස් කරගන්න තර කර ගන්න පිළිපදින පිළිවෙත මෙයදැයි මා සමග පැමිණි මිතුරාගෙන් අසුවෙමි. ඉස්ලාම් දහම තහනම් කළ සොරකම සහ මිනිසෙකු නිහීනයට පත් වීම වැනි කටයුතුවලින් මිනිසෙකුගේ තැන්පතු වීම හෝ හැඩගස්වා ගැනීම ඉස්ලාම් දහම කෙසේ වෙතත් සුවිනීත පුද්ගලයෙන් හෝ සාමාන්‍ය ජනයෙක් හෝ පිළි ගන්නේ නැත. මෙවන් මුග්ධ අදහස්වලින් හෙබි පොතකට අල්හිකම් ලිබ්නි අජීබා යනුවෙන් නම් කිරීම ගැනද විශ්මයට පත් වුනෙමි.

මේ අවස්ථාවේ කියන්නට තවත් වැදගත් එකක් වේ. මේ දේශනාව කළ භවතාට ඒ ගමේ බොහෝ ශිෂ්‍යයන් සහ අනුගාමිකයන්ද වූහ. වරෙක් ඔහු හජ් කර්තව්‍ය ඉටුකරන් නට මක්කාවට යන බව දැනුම් දී තිබුණි. එය ඇසූ ඔහුගේ ශිෂ්‍යයන් සහ අනුගාමිකයන් ඔහු සමග හජ් කටයුත්ත වෙනුවෙන් සහභාගි වන්නට තම මනාපය දන්වා තමන්ගේ නම්ද ලියාපදිංචි කර ගත්හ. කාන්තාවන් තමා සතු කණකර විකුණා මුදල් දුන්හ. මෙසේ විශාල මුදලක් තම අතට පත්වූ විගස ඒවා වංචා කරනු වස් යම්යම් හේතු නිසා මෙවර හජ් කටයුත්තට යා නොහැකියයි විවෘතව දැනුම් දී හජ් කටුයත්ත කිරීමෙන් වළකී ඔවුන් හජ්

වෙනුවෙන් දුන් මුදල් කිසිදු චකිතයකින් තොරව මහු තම උවමනාවන් පිණිස පාවිච්චි කළේය. මෙවන් අය ගැන අල්ලාහ් දෙව්දූ විවෘතව මෙසේ අනතුරු අඟවයි :

*විශ්වාස වන්තයිනි, පාදිරි වරුන්ගෙන්ද සන්‍යාසක වරුන්ගෙන්ද බොහෝ දෙනෙකු මිනිසුන්ගේ ධනය නිකරුණේ අනුභව කරන්නෝය. තවද අල්ලාහ්ගේ මාර්ගයෙන් (මිනිසුන්) වළකති.* (9 : 34)

මහු මහා වංචා කරයෙකු බවත් කුට උපාය වලින් ජීවත් වන්නෙකු බවත් පසු දිනෙක, පෙර මහුගේ ප්‍රධාන අනුගාමිකයෙකු මා සමග පැවසුවේය.

සූෆිවරුන්ගේ දික්ර් කටයුතු

සූෆිවරුන් තම දික්ර් කටයුත්ත කරන්නේ කෙසේදැයි මනාව දැනගනු වස් වරෙක මවුන්ගේ දේවස්ථානයකට ගියෙමි. දික්ර් සබයේ සමහරුන් ගායනාවල යෙදී සිටි යහ. මවුන් ගායනා කළ ගායනා සියල්ලම වාගේ අර්ථ කථනය වූයේ තම දුක්දොම්නස් සහ ලෙඩරෝග ඉවත් කරන ලෙස අල්ලාහ් හැර මවුන්ගේ නැසීගිය ප්‍රධානීන් සහ මුනිවරුන්ගෙන් බියබැතියෙන් ඉල්ලන අයුරෙනි. එසේ නැසීගිය අයගෙන් උදව් උපකාර පැතීම අල්ලාහ්ට ආදේශ කිරීම බව අල්කුර්ආන් ඉදුරාම අනතුරු අඟවයි. නිදසුනක් වශයෙන් මෙසේ මොවුන් කරන ගායනා මවුන් ඇහුම්කන් දෙනවා යැයි පිළිගත්තද ඒවාට පිළිවදන් දීමට තරම් හැකියාවක් ඒ මලගිය ඇත්තන්ට නැත. එසේම අනුන්ට උදව් කිරීම කෙසේ වෙතත් තමනට පවා උදව් කිරීමට හැකියාවක් මවුන්ට නැත. මියගොස් මිහිදන් වූ අය ගැන විස්තර කරනවිට අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

*තවද, ඔහු හැර ඔබ අමතන අය (රට ඉඳි) ඇටයක් මතවූ සිවියක් තරම්වූ බලයක් පවා නැති අය වෙති. ඔබලා ඔවුනට අඬ ගැසුවද ඔවුන් ඔබගේ අඬ ගැසුමට සවන් නොදෙනු ඇත. පරමාත්ත දිනයේ ඔබ තැබූ සමාන කම්ද ඔවුන් ප්‍රතික්ෂේප කරනු ඇත. සියල්ල දන්නා දන්වන සේ කිසිවෙක් ඔබට නොදන්වන්නේය.*(35 : 13 - 14)

ඒ දික්ර් කටයුත්තට අවසන්වී පිටවුනු ඒ දේවස්ථාන යේ ඉමාම් මුණ ගැසී ඔවුන් සහභාගි වූ දික්ර් සභාවේ අල්ලාහ් මතක් කරන අටියෙන් හෝ අල්ලාහ් ප්‍රශංසා කරන විලසින් හෝ කිසිදු දික්ර් පදයක් නොවූ බවත් ඔවුන් ගායනා කළ සියළු ගායනා නැසිගිය අය සිහි කරමින් ඔවුන්ගේ උදව් උපකාර පතා කළ ඒවා බවත් මම ඔහුට මතක් කර දී අල්ලාහ් මිස අපට ආරක්ෂාව සළසා දිය හැකි අනෙකකු වේදැයි ඔහුගෙන් විම සුවෙමි. අල්කුර්ආනයේ පදවලට මනා තේරුමක් ඇති ඔහු මගේ පැනයට පිළිවදන්දිය නොහැකිව මුනිවත රැක් කේය. ඇත්තෙන්ම අල්කුර්ආනය ගැන දන්නා කෙනෙකු මෙසේ මුග්ධ ලෙස කටයුතු කිරීම ගැන මට ඔහු කෙරෙහි ඇති වූයේ අනුකම්පාවකි. ඔහු එසේ නිශ්ශබ්දව සිටියද අල්ලාහ් දෙව්දූ එයට මනා ලෙස අල්කුර්ආනය තුලින් මෙසේ පිළිවදන් දෙයි : *(මිසදිටුවනි) ඔහු හැර ඔබ අමතන අයට ඔබට උදව් කරන්නට (කිසිදු) ශක්තියක් නැත. තමනටද උදව් නොකර ගනිති.* (7 : 197)

තවත් වරෙකද ඒ දේවස්ථානයට ගින කළ නැමදුම අවසන් කර ඔවුන්ගේ දික්ර් කටයුත්ත ආරම්භ වනු දැකගත හැකි වුනු අතර සූෆි නායකයෙක් සහ ඔහුගේ අනුගාමිකයන් පිරිසක්ද අල්ලාහ්, ආහ්, හී, හූ යනුවෙන් දික්ර් කරමින් පසු වූහ. ඔවුන්ගේ තවත් ප්‍රධානියෙකුද ඒ ගායනාව අනුව

ඇල වෙමින් පැද්දෙමින් ඒ දික්ර් කටයුත්ත උනන්දුවෙන් අවධානය කරමින් සතුටු වන්නට විය.

මංගා ගති

පෙර සඳහන් සූෆි ප්‍රධානියාගේ ශිෂ්‍යයෙක් කඩයක් කුලියට ගෙන තිබුණු අතර පසුව මම ඒ කඩය මිලයට ගත්තෙමි. කඩය මිලයට ගත් පසු එහි අයිති කරුවා කඩය දීමට පරක්කු වන්නේ නම් එහි වගකීම ඔහුට භාර ගත යුතු බව කී කළ ඔහු එය පිළි ගත්තේය. නමුදු මාස කීපයක් ගතවීමෙන් පසු කඩේ අයිති කරුවා කඩය දීමට ප්‍රති ක්ෂේප කළ විට මම ඒ ගැන ඔවුන්ට දැනුම් දුන්නද ඔවුන් ඒ ගැන කිසිවක් නොකියා විවිධ හේතු දක්වමින් ප්‍රශ්ණයෙන් පිට පනිමින් කාලය ගත කරන්නට වූහ.

ඔවුන් හජ් කර්තව්‍ය ඉටු කරන්නට මක්කාවට යෑම ගැන මට ආරංචි වූ අතර එවැනි වංචා කරුවන් සහ ගුණමගුවන් වියදම් කර හජ් කටයුත්ත කිරීමෙන් ඇති ඵලය කුමක්ද? තවත් වරෙක ඒ ප්‍රධානියාගේ තවත් සම හර සුමිතුරන් මුණ ගැසී ඔහු කළ වංචාව ගැන ඔවුන්ට දැනුම් දුන්නෙමි. ඔවුන්ද ඒ කිසිදු තැකීමකින් තොරව අපට කරන්න දෙයක් නැත යන පිළිතුරක් පමණ අපට දී ඉවත් වී ගියහ.

ඒ කඩ අයිතිකරුට පේෂකර්ම කම්හලක් වේ. මට කඩය විකුණන්නට පොරොන්දු වූ තැනැත්තාද එහි සේවය කළ හෙයින් ඔහු මුණ ගැසීම පිණිස මම කීප විටක්ම එහි ගියෙමි. මා කීපවිටක්ම ඔහු මුණ ගැසෙන්නට පැමිණෙන බව ඔහුගේ තවත් මිතුරෙක්ද දැන ගත්තේය. වරෙක එහි ඔහු මුණ ගැසුනු මම උවමනාවක් පිණිස ඔහුගේ මිතුරා

මැදකට කැඳවන්නට හැකිදැයි ඔහුගෙන් විමසුවෙමි. ඔහුට මට උදව් කිරීම වෙනුවට නොමනා අන්දමින් කතා කරන්නට විය. මෙසේ වංචා කරමින් විශ්වාස භංගව කටයුතු කරන්නන් ගැන මුහම්මද් තුමා දෙසූ දෙසුමක් මෙසේ වේ : 'බොරු කීම, විශ්වාස භංගව, කටයුතු කිරීම සහ ප්‍රතිඥා වකට පත්වූ කළ එයට පටහැනිව කටයුතු කිරීම සහ සණ්ඩුදබර අවස්ථාවනහී නොමනා අන්දමින් වචන පාවිච්චි කිරීම වැනි කටයුත් තන්හී යෙදෙන්නා කුහකයෙකි. එවන් ගුණාංගයක් කා සතු වේදෝ එයින් ඔහු ඉවත්වන තුරු ඔහු තුල කුහක කමේ කොටසක් පවතී'. (මුස්ලිම්)

ඒකේශ්වරවාද ධර්මය වෙත

'ඔබ පතන්නේ නම් අල්ලාහ්ගෙන් පමණක් පතව. උදව් ඉල්ලන්නේ නම් අල්ලාහ්ගෙන් පමණක් උදව් ඉලියව්' යනුවෙන් තිර්මිද් ග්‍රන්ථයේ සඳහන් හදීසය කියවමින් සිටියෙමි. මේ හදීසයට ඉමාම් නවවි තුමාගේ 'කෙනෙකු ප්‍රාර්ථනා කරන විට ඉදිරිපත් කරන කරුණු මිනිසා විසින් ඉටු කළ හැකි කරුණු වන යහමග පෙන්වීම, ඥානය ලැබීම, ලෙඩරෝග සුව කිරීම සහ සුවය දීම වැනි දේ අල්ලාහ්ගෙන් පමණක් ඉල්ලා ප්‍රාර්ථනා කළ යුතුය. එසේ නැතිව ඒවා අල්ලාහ් දෙවිඳුගේ මැවීමක් වන මිනිසාගෙන් ඉල්ලා සිටීම ඉතා පහත් ප්‍රාර්ථනාවකි' යනුවෙන් වූ අර්ථකථනය මා ඉතා උනන්දුවෙන් අධ්‍යයනය කළෙමි.

පසුව කියවීම මදක් නවතා මේ හදීසයෙන් අර්ථකථනය වන්නේ අල්ලාහ් හැර අන් කිසිදු මැවීමක් මගින් උදව් උපකාර පැතීම තුසුදුසු යන්න නොවේදැයි මම මගේ ගුරුවරයාගෙන් විමසුවෙමි. එයට ඔහු අල්ලාහ් හැර අන් අයගෙන්ද උදව් පැතිය හැකිය යනුවෙන් වූ විකල්ප

අදහසක් ඉදිරිපත් කළේය. එයට සාධකයක් වෙදැයි විමසූ විට මා දෙස රවා බලා මගේ නැන්දා සැම මොහොත කම තම උවමනාවන් ඉල්ලා කන්නලව කරන්නේ සඅදු වලියුල්ලාහ් වෙතයි කී කළ 'ඔබ ඔබගේ උවමනාවන් සඅදු වලියුල්ලා ගෙන් ඉල්ලන්නේ නම් එතුමා ඒවා ඉටු කර දෙනවාදැයි මම ඇගෙන් විමසුවෙමි. එයට ඇය මා මගේ උවමනාවන් එතුමා වෙත ඉදිරි පත් කරන විට එතුමා මගේ උවමනා වන් අල්ලාහ් වෙත ඉදිරිපත් කර ඉටු කරයි යනුවෙන් මගේ මුහුණට කඩා පනිමින් උත්තර දුන්නාය.

මම තුමා ආගමික පොත්පත්වලින් ඉගෙන ගෙන යමක් කමක් දන්නා ආගමික ලබ්ධිකයෙකු ලෙස වෙද්දී මගේ ප්‍රතිපත්තිමය අදහස් කිසිදු දහමීය දැනුමක් නැති මගේ නැන්දාගෙන් ලබාගන්නේ ඇයිදැයි මගේ ගුරුවරයාගෙන් විමසුවෙමි. එයට මා දෙස රවා බැලූ ඔහු උම්රා කර්තව්‍ය ඉටු කරන්නට මක්කාවට යනවා යැයි කියමින් ගොස් ඔබ එහි සිට වහ්හාබි පොත්පත් ඔබ ගෙන එනවා. ඔබ ලඟ තියෙන්නේ වහ්හාබි අදහස් යනුවෙන් පවසන්නට විය. වහ්හාබිවරුන් සාමාණ්‍ය ජනතාවට වඩා මනා දහමීය දැනුමක් ලබාගත් අය වෙ. ඔවුන් තරීක්කා වරුන්ගේ අදහස් සහ වලිවරුන්ගේ හාස්කම්විස්තාම් ගැන විශ්වාස කරන්නේ නැත. වහ්හාබි වරුන් අදහාස් කරන අයුරු සියළු ලෙඩරෝග ඉවත් කරන්නේ අල්ලාහ් බව පිළි ගන්නේ නම් එය අල්කුර්ආනයට පටහැනි නැත යනුවෙන් මගේ සිත මටම කියන්නට විය.

මගේ ගුරුතුමා සඳහන් කළ වහ්හාබිවරුන් කවරෙක්ද? ඔහුන් සිටින්නේ කොහිද? යනුවෙන් ඔහුගෙන් විමසූ කළ මෙහි අසල ගමක මස්ජිදයක ඔවුන් එක්රැස්වන බවත්

එහි අල්කුර්ආන් අර්ථකථනය, හදිස් පැහැදිලි කිරීම් සහ දහමීය නීතිරීති ගැන විෂය මාලාවන් සිදුවන බවත් මහු කිවේය. පසුදින මගේ ළමයින් සහ සමහර යහළුවන් සමග ඒ මස්ජිදයට ගියෙමි. මා එහි යන විට තවත් කීප දෙනෙකුම දේශනය පවත්වන තුරු නොඉවසිලිවන්තය බලා ගෙන සිටියහ. විනාඩි කීපයක් ගතවන්නට පෙර තරමක වයෝවෘද්ධ පුද්ගලයෙකු සලාම් කියමින් අප වාඩි වී සිටි ස්ථානයට ඇතුල් වී එහි අසුන් ගෙන සිටි සියළු දෙනාට දකුණු පසෙන් පටන් ගෙන අතට අතදී සුභ පතා මහුද අප සියළු දෙනාට ඉදිරියෙන් අසුන් ගත් තේය. මහුගේ ඒ හැසිරීම මොහු සාමාන්‍ය ජනතාවගේ නම්බුනාමය ගෞරවය බලාපොරොත්තු නොවන චරිතවත් කෙනෙකු බව මනාව පිළිඹිමු විය.

මහු දේශනය ආරම්භ කරන්නට ප්‍රථමව මුහම්මද් තුමා දේශයන ආරම්භ කරන විට අල්ලාහ් ප්‍රශංසා කර මුහම්මද් තුමා කෙරෙහි සලවාත් කියා, මහු ප්‍රශසංසා කර මහුගෙන උදව් උපකාර පතා පව් සමා අයදිමි යනුවෙන් පවසා ආරම්භ කරන අයුරු ආරම්භ කළේය. දේශනය අවසන් කළ පසු කුඩා කඩදාසි කැබැලි අපට දී තමා කළ දෙශනයේ යම් ප්‍රශ්ණයක් වේ නම් ඒවා ලියා දෙන අප සැම දෙනාගෙන්ම ඉල්ලා සිටියේය. පසුව අපගෙන් සමහ රෙකු ඇසූ ප්‍රශ්ණවලට පැහැදිලි උත්තර දුන් මහු තවත් සමහර කුර්ආයේ සහ හදීස් සම්බන්ධ මතෘකා ගැන පොදුවේ අදහස් පැහැදිලි කළේය.

අවසානයේ ‘අපමුස්ලිම්වරු වන අතර මුහම්මද් තුමාගේ සහ එතුමාගේ සුමිතුරන්ගේ මග පිළි පදින්නන් ලෙස නියම මගෙහි සිටින්නන් වෙමු. නමුදු අපගෙන් සමරෙක් තමන්

මුස්ලිම්වරුන් යැයි කියා ගත්තද ඉස්ලාම් දහම පෙන්වන මගට පටහැනිව අදහස් ඉදිරිපත් කර අප වහ්හාබිවරුන් යැයි කියා මිනිසුන් අතර වැරදි අවබෝධයක් වපුරමින් පසුවෙයි. නමුදු අල්ලාහ් දෙවිඳු මෙසේ කීම ඉඳුරාම හෙළා දැක මෙසේ විස්තර කරයි :

*ඔබලා (ගෙන් සමහරෙක් නොමනා) විකට නමින් (අනෙකාට) නොඅමතන්න.* (49 : 11)

තවද ෂාෆි ඉමාම් තුමා විසූ සමයේ ඔහු රාෆිළි පාර්ශවයට අයත් කෙනෙකු යැයි කියා නිගීත කළහ. නමුදු එයට අතුල් පහරක් වන විලසින් 'රාෆිළිවරු පිළිපදින්නන් මුහම්මද් තුමාගේ එතුමාගේ සුමග ගිය සුමිතුරන්ගේ මග පිළිපදින්නන් නම් මාද ඔවුන් පිළිපදින්නෙක් යනු වෙන් මිනිසුන්ද ජින්වරුන්ද පවසද්දෙන්' යනුවෙන් කීහ.

එසේම මා වහ්හාබි යැයි යමෙකු පවසන්නේ නම් මුහම්මද් තුමාගේ ආදර්ශමත් මග පිළිපැද කටයුතු කරන්නේ වහ්හාබියෙකු නම් ඔවුන් මා වහ්හාබියෙකු යැයි කීම ගැන ආඩම්බර වන බව කියන්නට කැමැත් තෙමි යනුවෙන් අපගේ දේශකයාද පවසා එදින දේශන මාලාව අවසන් කළේය. දේශනා කරන අවස්ථාවේ ඔහුගේ හැසි රීම සහ නිවුණු ගතිය අප සියළු දෙනාගේ සිත් ගන්නට තරම් උසස් ස්වභාවයක විය. ඇත්තෙන්ම පිළිගත යුතු ෂෙයික් මොහුය යනුවෙන් අප අතර සිටි මදක් සූෆි සභාවට බරවුනු කෙනෙකු කියනු මගේ දෙසවනට ඇසුණි.

සූෆිවරුන්ගේ ක්‍රියාකලාපය

මා සලෆිවරුන්ගේ පැත්තට සහ ඔහුන්ගේ දේශනවලට උනන්දුවෙන් සහභාගි වන බවත් ඉස්ලාම් දහම හදා

රත්න විද්වත් නසීරුද්දීන් අල්බානි තුමා වෙත යන බවත් දැන ගත් අප ගමේ සූෆි ප්‍රධානියා වරෙක 'මම තුඹ මහුගෙන් වෙන්කරනවා' යනුවෙන් මට තර්ජනාත්මකව පැවසූවේය. නමුදු මම සලෆිවරුන්ගේ පන්ති සහ දේශනවලට මැද නතර කළේ නැත. සූෆි දෙවස්ථානයට යාබදව වාසය කරන කෙනෙකුද ඒ දේශනයට සහභාගි වූයේය. මහු සමග කතාවට පැටලුනු විට සූෆි ප්‍රධානි යෙකු විසින් කරන ලද දේශනයක සම්භවයක් මට විස්තර කරන්නට විය.

දිනක් සූෆි ප්‍රධානියෙකු විසින් පවත්වන ලද දේශනය කට සහභාගි වුනෙමි. දේශනමාලාව පටන්ගත් පසු ඒ දේශකයා මෙසේ කියන්නට විය. තම ශිෂ්‍යයෙකුගේ බිරිඳට ප්‍රශව වේදනාව ඇති වූ විටෙක හෙතෙම සූෆි ප්‍රධානියා වෙත ගොස් උදව් පැතූ කළ මහුගේ ද්‍යානය මගින් ඇගේ ප්‍රසූතිය පහසුවෙන් සිදුවනු ඇතැයි කීවේය. ඒ සම්භාවය මා සමග බෙදා ගනු ඇසූ ප්‍රධානියා 'ඒ සම්භාවය මෙහි ඇති වැදගත්කම කුමක්දැයි' තරහෙන් මහු වෙත කඩා පැන්නේය. එවිට මා සමග කතාවේ සම්බන්ද වී සිටි පුද්ගලයා 'ඒ ශිෂ්‍යයා තම ප්‍රධානියා ගෙන් උදව් පැතීමෙන් අල්ලාහ්ට කළ යුතු වන්දනාමාන මහු අල්ලාහ්ගේ මැවීම් හට කර ඇත' යනුවෙන් ප්‍රධානියාට පැහැදිලි කර කීවේය.

එවිට ඒ ප්‍රධානියා කෝපයෙන් වත රතු කරගෙන 'කට වහනවා, මබ කරන්නේ කම්මල් වැඩ, මබ දන්නා ෂිර්ක් කුමක්ද? අපි දහම ගැන මනා ඇති අය වෙමු. ෂිර්ක් ගැන මබට වඩා අප දන්නවා' යනුවෙන් වහා නැගිට මහු අසල තිබුණු 'අද්කාර් නවවි' නම් පොත අතට ගෙන 'උමර් බින් කත්තාබ් තුමා කකුලේ වේදනාවෙන් ඉදිමුම් ඇතිවන

විට 'යා මුහම්මද්' යනුවෙන් ප්‍රාර්ථනා කරනු ඇතැයි කියනු ඇත. එසේ කීම ආදේශ කිරීමක්ද?' යි විමසන්නට විය.

එවිට මා අසල සිටි ශිෂ්‍යයා ඒ කියමන උමර්ගේ නාම යෙන් නිබන්ධනය කරන ලද කියමනක් මිස වෙන එකක් නොව යනුවෙන් උත්තර දුන් විට 'සහීහ් (සත්‍ය) ලර්ෆ් (බෙලහීනය) ගැන ඔබ කුමක් දන්නවාද? අප දහමීය විද්වතුන් වෙමු. අපි ඒ ගැන මනාව දන්නා අය වෙමු' යනුවෙන් මා දෙස බලා 'මීට පස්සේ මොහු මේ පැත්තට ආවානම් මොහු මරා දමනවා' යනුවෙන් තර්ජන කර තම දේශනය අතරමග නතර කර ඉවත් ගියේය.

එවිට අපද දේවස්ථානයෙන් පිටවන විට ප්‍රධානියා සමග සංවාදයට පැටලුනු ඔහු මා අමතා තමා ලඟ වැරදි නිදොස් කර සකස් කරන ලද අද්කාර් නවවි පොතේ පිටපතක් ඇති බවත්, මගේ පුතා ඔහුගේ නිවසට පිටත් කරන්නේ නම් ඒ පොත දෙන බවත් කීවේය. එදින ඒ පොත ලබාගත් මම ඒ ගැන සොයා බැලීමේදී ඒ ප්‍රධානියා කී සම්භාවය වැරදි සහගත ප්‍රබන්ධනය කළ බෙලහීන එකක් බව එහි සඳහන් වී ඇති බව වටහා ගත්තෙමි. පසුදින දේවස්ථානයට ගොස් ඒ ප්‍රධානියා මුණ ගැසුණු මා ඔහු විසින් කලින්දා කියවන ලද සම්භාවය වැරදි එකක් බව ඔහුට කීවෙමි. නමුදු ඔහු ඔහුගේ සදොස් බව පිළි නොගෙන මෙය යහකර්මයේ යහපත්කම යන පොතේ සඳහන්වී ඇති කරුණක්. ඒ නිසා යහකමක් කරන විට බෙලහීන කියමන් සහ හදීස් අනුව කටයුතු කරන්නට පුළුවන් යනුවෙන් කීවේය.

හුදෙක් ඔහු අදහස් කරන අයුරු එය යහකර්මයේ යහපත්කම නම් ග්‍රන්ථයේ සඳහන්වූ කරුණක් නොවේ.

වෙනුවට බෙලහීන අසත්‍ය හදීස් ගොතු කරගෙන නොකළ යුතු, කරන්නට නොහැකි දේ ගැන පවසන ප්‍රබන්ධිත පොතක සඳහන් කර ඇති කරුණු වේ. තවද ඉමාම් මුස්ලිම් වැනි විද්වතුන් කිසිදු හේතුකදුවක් මත බෙලහීන හදීස් යහකම් කිරීමට නොහැකි බව ස්ථිරසාරව පවසා සිටී. පසුකලෙක සමහර විද්වතුන් බෙලහීන හදීස් සාදක කරගෙන යහකම් කළ හැකි බව කීවද ඒවාට සම හර හේතුපාදක ගැන සොයා බලන විට එසේ කළ නොහැකි බව විස්තර කර ඇති බව වටහා ගත යුතුය.

පසුදිනද මහු අප දේශනයට සහභාගි වුවද සලාතය අවසන් කළ ඒ ප්‍රධානියා දේශනයට සහභාගි නොවී දේවස්ථායෙන් පිටවී යනු අප බලාගෙන සිටියෙමු.

තවද වසීලා සෙවීම හෙවත් අල්ලාහ්ගේ සමීපත්වය ලබා ගැනීමට උත්සාහ සෙවීම වැනි කාරණාවන් පිණිස අල්ලාහ් හැර අන් අයගෙන්ද ඉල්ලිය හැකි යනුවෙන් මා තෘප්ති මක් කිරීමට උත්සාහ කළ ඒ ප්‍රධානියා ඒ සම්බන්ධ සම හර පොත්පත් මට දී කියවා බලන ලෙස ඉල්ලා සිටියේය. මහු දෙන පොත් අතර 'තාජ්ත් අල් කවසරි' යම් පොත කියවා ගෙන පසුවූ කළ එහි එක් තැනක අල්ලාහ් හැර අන් අයගෙන් උදව් උපකාර පැතිය හැකිය යනුවෙන් සඳහන් වී තිබුණි. නමුදු ඒ පොතේ පවසන කරුණුවලට හාත්පසින්ම සත්‍ය කරුණක්අල්කුර්ආනයේ මෙසේ පවසයි :

*අල්ලාහ් හැර ඔබට (කිසිදු) සැපතක් හෝ නපුරක් හෝ කළ නොහැකි දැය නොඅමතනු. ඔබ (එසේ) කළේ නම් ඇත්තෙන්ම ඔබ වර. කරනවුන්ගෙන් (කෙනෙක්)ය.* (10 : 106)

තවද මුහම්මද් තුමා පවසන කළ ප්‍රාර්ථනාවද වන්දනා මානයවක් බව පවසා ඇත. (තිර්මිදි)

මහු විසින් මට දෙන ලද පොත්පත් මා තෘප්තිමත් කරන්න්ට තරම් සමත් නොවූ හෙයින් මා සමග උරණ වූ ඒ ප්‍රධානියා 'මොහු වහ්හාබි කෙනෙක්. මොහු සමග ප්‍රවේශ මෙන් ආශ්‍රය කරව්. මොහු උඹලා නොමග යවාවි' යනු වෙන් විශාල ප්‍රචාරයක් මා ගැන මුදා හැරි යේය. ඒ ගැන දැනගත් මා 'මුහම්මද් තුමාගේ සමයේ පවා මෙසේ සිදුවුනා. මුහම්මද් තුමා බොරු කාරයෙන් සූනාය කරන් නෙක්' යනුවෙන්ද ඉමාම ෂාෆි තුමා සත්‍ය වටහා ගෙන ඒ අනුව ජීවත්වූ කළ රාෆිළි පාර්ශවයට අයත් කෙනෙක් යනුවෙන්ද ආඩපාලි දොඩන්නට වූහ යනුවෙන්ම තෘප්තිමත් වුනෙමි.

එදා පටන් මම සත්‍ය ඒකේශ්වරවාද ධර්මය ගැන දැන ගන්නටද ඒමග ගිය නියම විශ්වාසන්තයන්ගේ ප්‍රතිපත්ති සහ සංකල්පනා ගැන අධ්‍යනය කිරීමට උනන්දු වූ අතර, ඒ අනුව මගේ ජීවිතය ගත කරන්නට පටන් ගත්තෙමි.

දිනක් මගේ කලණ මිතුරෙකු සමග අප ගමේ ජුම්ආ මස්ජිදයේ සේවය කරන ඉමාම් මුණ ගැසෙනු වස් එහි ගියෙමි. මහුට විශාල ගෝලබාලයන් සහ භක්තිකයන් පිරිසක් ඇති බ මට පැදැලිවම දැන ගන්නට හැකි වූස් මා එහි ගිය පසුවයි. මහු සමග සමහර දහමීය කරුණු සාකච්ඡා කරමින් පසුවන විට එහි එක් මාතෘකාවක් ලෙස උදව් උපකාර පතන්නේ නම් අල්ලාහ් හැර අන් කිසිවෙ කුගෙන් උදව් උපකාර පැතීමට නොහැකි බව තර්කානුකූ ලව ඉදිරිපත් කර මතු සඳහන් අල්කුර්ආන් වැකිය ඉදිරි පත් කළෙමි.

*ඔහු හැර (වෙන දෙවිවරු ඇතැයි) ඔබ පිළිගෙන ඇති අය(ඔබ කරදර ඉවත් කරනු වස්) අමතනු. (එසේ අමතුවේ නම්) ඔබගෙන් විපතක් පහ කරන්නට හෝ මාරු කරන්නට හෝ ඔවුනට බලපුළුවන් කමක් නැත යනුවෙන් (නබි තුමනි) ඔබ පවසනු මැනවි. (ආදේශ කරන්නන් අල්ලාහ් හැර) මොවුන් අමතන්නේ කවරෙක්ද ඔවුන් - තම දෙවිඳු වෙත (කුසල් කර්මයන් කරමින්) ඔවුන්ගෙන් සමීපතමයා කවරෙක්ද යනුවෙන් සමීපයට විධි සොයති. එසේම ඔහුගේ දයාභාවයද අපේක්ෂා කරයි. ඔහුගේ දඬුවමටද බිය වෙති. සැබැවින්ම ඔබ දෙවිඳුගේ දඬුවම බිය විය යුතු දැය වේ.* (17 : 56-57)

මා ඒ අල්කුර්ආන් වාක්‍ය කියා අවසන් කර එහි ඌලා ඉකල්ලදීන යද්ඌන යනුවෙන් කියවෙන්නේ කුමක්දැයි මම ඔහුගෙන් විමසුවෙමි. එයට ඔහු ඒ වචනය නියෝජනය වන්නේ පිළිමයන් බව වහා කීවේය. එසේනම් අල්කුර්ආනයේ අව්ලියාඋ වස්සාලිහීන් යන වචනයෙන් අදහස් කරන්නේ කුමක්දැයි ඔහුගෙන් විමසූ කළ ඒ ගැන ඉබ්නු කසීර් කුමක් අර්ථකථනය කරනවාදැයි විමසා බලමු යනුවෙන් පවසා ඉබ්නු කසීර්ගේ අල් කුර්ආන් විවරණය ගෙන ඒ වදනට දී ඇති තේරුම ගැන සොයා කියවන්නට පටන් ගත්තේය. ඒ වදනට ඉබ්නු කසීර් අදහස් කීපයක් ඉදිරිපත් කර තිබුණද එය හරියාකාරව වටහා ගනු වස් ඉමාම් බුහාරි තුමා ඒ සම්බන්ධ ඉදිරිපත් කරන හදීසය ගෙන කියවන්නට විය. එහිදී 'මිනිසුන්ගෙන් කොටසක් ජින්වරු වන්ද නාමාන කළ බවද ඒ ජින්වරු ඉස්ලාමය පිළිගත් පසු ඔවුන් තම මාර්ගයෙන් ඉවත් නොවී එසේම සිටි බවත් සඳහන් වී තිබුණි.

ඉමාම් බුහාරි තුමාගේ අදහස කියවූ ඔහු පසුව මා ඉදිරිපත් කළ කරුණ හරි බව පිළිගත්තේය. ඔහු එය පිළිගත් පසු කෙසේ හෝ යමෙකු මද ප්‍රමාණයකින් හෝ අඳුරෙන් එළියට ගැනීමට හැකි විය යනුවෙන් සතුටු වූ අතර එයට පසු නිතර නිතර ඔහු මුණ ගැසෙන්නට ගියෙමි.

දවසක් ඒ මස්ජිදයේ ඉමාම් මුණ ගැසෙන්න ගිය විට ඔහුගේ ශිෂ්‍යයන් කීප දෙනෙකුම මුණ ගැසෙන්නටද අවස්ථාවක් උදාවිය. එවිට රූහ් හෙවත් ආත්මයන් විශ් වාස නොකරන වහ්හාබි වරුන් කාෆිර්වරුන් සේය යනු වෙන් ඒ ඉමාම් තම සිසුන්ට පවසන්නට විය. ඔහුගේ ඒ දේශන යෙන් මදක් විශ්මයට පත් වූ මම ඔහු තම තත්ත්වය ආරක්ෂා කර ගනු වස් පෙර ඔහුගේ මතයෙන් මදක් වෙනස් වී තම ගෝලයන්ට එසේ පවසනවා විය හැකි යැයි සිතුවෙමි. අල්කුර්ආනය සහ හදීස් සංකල්පය පවසන රූහු ගැන වහ්හාබිවරු විශ්වාස කළද සූෆිවරුන් විශ්වාස කරන අයුරු ඒ රූහ් විසින් කිසිවෙකුට කිසිදු ආරක්ෂාව සැපයීමට හෝ පිටිවහළක් වීමට හෝ හොඳක්, නරකක් කරන්නට හෝ කිසිදු ශක්තියක් නැත. එසේ යමෙකු විශ්වාස කරන්නේ නම් එය අල්කුර්ආනයට පටහැනි අල්ලාහ් දෙවිඳුට ආදේශ කිරීම හා සමාන වන විශාල පවකි. ඒ ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

*තවද, ඔහු හැර ඔබ අමතන අය (රට ඉඳි) ඇටයක් මතුවූ සිවියක් තරම්වූ බලයක් පවා නැති අයයි. ඔබලා ඔවුනට අඬ ගැසුවද ඔවුන් ඔබගේ අඬ ගැසුමට සවන් නොදෙනු ඇත. පරමාන්ත දිනයේ ඔබ තැබූ සමානකම්ද ඔවුන්*

*ප්‍රතික්ෂේප කරනු ඇත. සියල්ල දන්නා දන්වන අයුරු කිසිවෙක් ඔබට නොදන්වන්නේය.* (35 : 13-14)

පෙර සඳහන් අල්කුර්ආන් වැකි මගින් පැහැදිලි වන්නේ මියගිය තැනැත්තන්ට කිසිදු කාර්යයක් කිරීමට නොහැකි බවත් ඔවුන්ට කරන ප්‍රාර්ථනා සහ අමතන ඇමතුම් පවා ඔවුන්ට සවන් දිය නොහැකි බවත්ය. නොවන්නට ඔවුන් මොවුන් අමතන ඇමතුම්වලට සහ පතන පැතුම් වලට සවන් දෙනවා යැයි තීරණය කළද ඔවුට ඒවාට කිසිසෙත් පිළිවදන් දිය නොහැකිය යන්න සක්සුදක්සේ පැහැදිලිය. එසේම මොවුන් අල්ලාහ් සමග ඒ මලගිය ඇත්තන්ද එක් කර වන්දනාමාන කිරීමට ඒ අය කිසිදු සම්බන්ධයක් නැති බව පරමාන්ත දිනයේ පවසන බවද අල්කුර්ආනයේම තවත් තැනක අල්ලාහ් දෙව්දු මෙසේ විස්තර කරයි :

*පරමාන්ත දිනයේ ඔබ තැබූ සමානකම්ද ඔවුන් ප්‍රතික්ෂේප කරනු ඇත.* (35 : 14)

තවද අප ඒ මස්ජිදයේ ෆජ්ර් සලාතයෙන් පසු එක්වී අල්කුර්ආනය පාරායනය කිරීම සිරිතක් වශයෙන් කළෙමු. දිනක් අල්කුර්ආනය පාරායනය කරන විට මතු සඳහන් වැකිය සඳහන් ජේදය පාරායනය කළෙමු.

*පවසනු මැනවි. අල්ලාහ් විනා අහසේ සහ පොළොවේ සිටින කිසිවෙකු ගුප්ත දැය නොදන්නේය.* (27 : 65)

එවිට මා වටා සිටි අය අමතා අල්ලාහ් හැර අන් කිසිවෙකුට ගුප්ත දැහී ඥානය ගැන දැනුමක් නැත යන්නට මේ එක් අල්කුර්ආන් වැකියම සෑහේ යනුවෙන් කීවෙමි. එය ඇසූ කීප දෙනෙකුම වලිවරුන්ටද අවලියා වරුන්ටද ගුප්ත දැහී ඥානය වෙ යනුවෙන් පවසන්නට වූහ. එයට සාධකයක් වේද යි විමසූ කළ තම තරීකාහී සමහර ප්‍රධානීන්ගේ සහ මියගිය

අයගේ නම් සඳහන් කර ඔවුන්ටද ගුප්ද දැහී ඥානය වෙ යනුවෙන් පිළිවදන් දුන් අතර තමන් සවන් දුන් ඔවුන්ගේ සමහර විස්තරද ඇදබාන්නට වූහ. ඒවා සත්‍ය කතා නොවිය හැකි බවත්, අල්කුර්ආනයට පටහැනිව ප්‍රබන්ධ කරන ලද ඒවා බව පැහැදිලිව ඇති බවත් එසේ අල්කුර්ආනයට පටහැනි ඒවා සත්‍ය බව පිලිගන්නේ කෙසේද යනුවෙන් ඔවුන්ගෙන් විමසුවෙමි. ඔවුන් මගේ පැනයට කිසිදු සැළකිල්ලක් නොදක්වා අල්කුර්ආනයට පටහැනි සමහර වෘත්තාන් තයන් ඇදබාමින්ද තම විශ්වාසය ගැන පුරසාරම් දොඩන්නට වූහ. මෙසේ අල්කුර්ආනය ගැන මනා වැටහීමක් නැති අය සමඟ විවාද කිරීම අනුවණ ක්‍රියා වක් බව වටහා ගත් මම ඔවුන්ගෙන් ඉවත්ව ගියෙමි.

පසුදින ඔවුන් සමග වාඩි නොවී දේවස්ථානයේ අනෙක් කෙළවරක වඩිවී එහි සිටි සමහර ළමුන්ට අල්කුර්ආනය කියා දෙමින් පසුවුනෙමි. කුර්ආනය මනා ලෙසන වන පොත් කර, අධ්‍යයනය කර වටහා ගෙන එයට පටහැනිව ක්‍රියා කරන්නන්ට වඩා මේ කුඩා ළමුන්ට කුර්ආනය ගැන ගැන අවබෝධයක් ලබා දීම වඩා උචිතයැයි වැටහුනු මම බොහෝවිට ඔවුන්ට කුර්ආන් වැකි සමහරක අර්ථ කථනය කරන්නට, පහදා දෙන්නට උනන්දු වුනෙමි.

මුස්ලිම්වරයෙකු ෂත්‍යය මෙයයැයි දැනදැනම සුම ගෙන් ඉවත්වී නොමගක සිටින්නේ නම් ඔවුන්ගෙන් ඉවත් වී තම කටයුතු කරගෙන සිටීම වඩා හොඳ බව අල්කුර්ආනය පහදා දෙයි. මන්දයත් සමහර විට ඔවුන් සිටින්නේ වැරදි මාවතක බව ආධාරක කොපමණ ඉදිරි පත් කළද ඔවුන් එය පිළිගැනීමට සූදානම් නැත. ඒ ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි:

*එහෙත් ෂයිතාන් (මේ ආඥාවෙන්) ඔබ අමතක (වීමට) කළ හොත්, (එය) සිහිපත් වූනායින් පසු, වරද කරන ඒ සමූහයා සමග අසුන් නොගනිව්.* (6 : 68)

මෙසේ අල්ලාහ් හැර වලිවරු, අව්ලියාවරු අන් අයටද ගුප්ත ඥායක් ඇතැයි පවසමින් අල්ලාහ් සමග ඔවුන්ටද වන්දනාමාන කරති ගරුබුහුමන් කරති. මෙසේ කිරීම අල්ලාහ් දෙවිඳුට ආදේශ කිරීමක් යන්න කිසිදු සැකයක් නැත. නමුදු මිනිස සම්භවයේ උතුම් පුද්ගලයා වන අව සාන වක්තෘ මුහම්මද් තුමාට පවා කිසිදු ගුප්ත ඥානයක් දැනුමක් නැති බව අල්ලාහ් දෙවිඳුම පරිශුද්ධ අල්කුර්ආනය තුලින්ම මෙසේ විස්තර කරයි :

*(නබිතුමනි) පවසන්න, අල්ලාහ්ගේ මනාපය නොවන්නට සෙතක් හෝ විනයක් හෝ කර ගැනීමට ශක්තියක් මට නැත. අදෘශමාන දැහී ඥානය මා හට වේ නම්, කිසිදු නපුරක් මා වෙත නොඇදී යහපත් දේ පමණක් අත්කර ගනිමි. එහෙත් මා අනතුරු අඟවන්නෙක් සහ විශ්වාස වන්න ජනයන් හට යහපත් දේ ගැන පවසන් නෙකු පමණක් මිස නොවෙමි.* (7 : 188)

මා ඉස්ලාමීය දේ සංකල්පයේ ෂත්‍ය තව්හීද් ගැන ප්‍රචාරය කරන බවද අල්ලාහ් හැර අන් කිසිවෙකු ප්‍රාර්ථනා නොකරන ලෙස ගම වැසියන් හට පවසමින් ඔවුන් නොමග වයන බවද ප්‍රසිද්ධියට පත් වන්නට විය. ඒ බව දැනගත් ඒ ගමේ සූෆි ප්‍රධානියෙකු මා මුණ ගැසී 'අල් කාෆි බිර්රද්දි අලල් වහ්හාබි' නම් පොතක් දී එය කිය වන ලෙස මට පැවසුවේය. මා ඒ පොත අවසානය වනතුරු ඉතා උනන්දු වෙන් කියවා එහි අඩංගු කරුණු ගැන මනා අවබෝධයක් ලබා ගත්තෙමි. එහි තැනක 'ඇති වව්' යනුවෙන් වූ

වදතින් ඇති කළ හැකි සමහර වලි වරුන් පසුවන බව සඳහන්වී තිබීම ගැන දැක විශ්මයට පත්වුනෙමි. එසේ අල්ලාහ් හැර අන් කිසිවෙකුට කළ නොහැකි බවත්, අඩුම තරමින් මැස්සෙකු පවා නිර්මාණය කිරීමට කිසිවෙකුට නොහැකි බවත් මැස්සෙක් ඩැහැගෙන ගිය දෙයක් පවා ආපසු ලබා ගැනීමට හැකියාවක් නැති නිර්මාණයවක් ලෙස මිනිසා නිර්මාණය වී ඇති බවත් මම අල්කුර්ආනය තුලින් මනාව වටහා ගෙන අත්තෙමි. ඒ ගැන අල්කුර්ආනය මෙසේ විස්තර කරයි :

*මිනිසුනේ, උදාහරණයක් පවසා ඇත. එයට සවන් දෙවු. ඇත්තෙන්ම අල්ලාහ් හැර ඔබ අමතන ඔවුහු එක්රැස් වුවද මැස්සෙක් පවා නිර්මාණය කිරීමට නොහැක්කෝමය. තවද ඔවුන්ගෙන් මැස්සා දැයක් පැහැර ගත්තේද උගෙන් එය මුදා ලන්නටද නොහැක්කෝමය. අයදින්නාද අයදිනු ලබන් නාද දුර්වලයෝමය.* (22 : 73)

එදින සැඳෑ යාමයේ ඒ පොත රැගෙන එය මට දුන් භවතාගේ නිවසට ගොස් එහි අල්කර්ආනයට පටහැනිව ඇති ඒ කරුණ ගැන විස්තර කර එය හරිදැයි මහු ගෙන් විමසුවෙමි. එය වැරදි වන්නේ කෙසේද? මුහම්මද් තුමාටෙ පවා එවැනි විස්කම් තිබෙණවා යයි මහු ස්ථිරසාරව පවසන්නට විය.

වරෙක මුහම්මද් තුමා 'එය සඅලබා විය යුතුය යනු වෙන් පවසන්නට පසුව ඒ සඅලබා විය යුතුය යනු වෙන් මුහම්මද් තුමා සමග යුද්ධයට සහභාගිවූ සඅලබා නම් එතුමාගේ සුමිතුරෙකු ගැනවූ සම්භවයක් ගැන විස්තර කළේය. එවිට මම 'සඅලබා ඉපදෙන්නට කලින් මුහම්මද් තුමා එසේ පැවසුවාද? නොවන්නට මහුගේ දෘෂ්ටියෙන්

නැති අවස්ථාවක එසේ කීවාද?' යනුවෙන් පවසා ඒ සිද්ධිය ගැන ඔහුට විස්තර කළෙමි.

මුහම්මද් තුමා සහභාගි වූ සටනකට සඅලබා වැනි සමහ රෙකු සමහර පුද්ගලික හේතුපාදක විදහාපාමින් යුද්ධයෙන් වැළකී සිටීමට උත්සාහ දැරූහ. නමුදු මුහම්මද් තුමාගේ සුමි තුරෙකු වන සඅලබා අවසාන මොහොතේ සේනාව පිටත් වූ පසු සේනාවට එකතු වන අටියෙන් වේගයෙන් ගමන් කරන්නට විය. ඔහු සේනාව පෙනෙන නොපෙනෙන දුර වේගයෙන් ගමන් කරනවිට යමෙකු ඈත පැමිණෙන ජායාව දුටු මුහම්මද් තුමා 'දෙවියනි, ඒ එන පුද්ගලයා සඅලබා විය යුතුය' යනුවෙන් ප්‍රාර්ථනා කළ අතර අල්ලාහ් දෙවිඳුද එතුමාගේ ප්‍රාර්ථනාව අනුමත කර ඒ පුද්ගලයා සඅලබා (රළි) බව තහවුරු කළේය යනුවෙන් ඒ සම්භවයේ යථාර්ථය මම ඔහුට සිත්තර කළෙමි. එවිට ඔහු එසේ නම් ඒ පොත ලියූ කතා වැරැද්දක් කළා විය හැකිය යනුවෙන් පවසා මගේ නිශ්ශබ්දව ඉවත් වී ගියේය.

සත්‍ය මගේ පසුවන ඉස්ලාමීය හිතවතුනි,

අප පෙර සඳහන් කළ තරීකා සහ අනෙකුත් කොටස් හී සමහර ක්‍රියාවන් සහ සංකල්පනා ගැන ඔබ යමක් දැන ගත්තා යැයි සිතමි. එසේම මෙවැනි අය සහ ඒවාට ප්‍රියමනාපශීලිත්වය දක්වන්නන්ද ඔබ ගමේ සහ ඔබ අවට සිටින්නට හැකිය. ඔබට හැකි අන්දමින් පරිශුද්ධ අල්කුර් ආනය සහ මුහම්මද් තුමාගේ සුන්නා සංකල්පය තුලින් ආධාරක ඉදිරිපත් කරමින් ඔවුන්ට ඔවුන්ගේ නොදැනුවත් කම ගැන අවබෝධ කර සත්‍ය පහදා දෙන්න උත්සාහ කරන්න. ඔවුන් කරන දෙයක් කරගෙන යනුවෙන් අපද නොසැළකිල්ලෙන් පසු වන්නේ නම් ඇත්තෙන්ම අප

වැරදි කරුවන් වී අල්ලාහ්ට වගකිව යුතු පුද්ගලයන් වෙමු.

එසේ නොවන්නට ඔබලාද එවැනි තරිකාවන්හී බැඳී එහි කෙරෙන අල්ලාහ්ගේ ඒකීය දේවත්වයට පටහැනි නූතන ක්‍රියාවන් ප්‍රියශීලීව කරගෙන ඒවායේ සාමාජිකත්වයක් ලබාගෙන ඔවුගේ ශයිත්වරුන්ගේ අත්පා සිඹ ඔවුන්ගේ ආශිර්වාද ලබාගෙන, සත්‍ය වටහා ගත් පසුවද පව සමා අයැද ඒවායෙන් ඉවත් නොවී ඔබ එසේ ක්‍රියා කරගෙන යන්නේ නම් ඇත්තෙන්ම අල්ලාහ්ගේ ඝෝරතර දඬුවමෙන් ඔබට ගැලවීමක් නොලැබෙන බව තරයේ වටහා ගන්න.

එහෙයින් අප කවදා හෝ යා යුතුව ඇති ඒ අල්ලාහ් දෙවිඳු වෙත යන්නට පෙර අප පසුවන ප්‍රතිපත්ති සහ අන්ධානුකරයෙන් පිළිපදින සංකල්පන වලින් ඉවත් වී අල්කුර්ආනය සහ සුන්නාහ් සංකල්පය පවසන මග උගැනුම ලබා ඒ මස්සේ පිය නගන්නට අදිටන් කර ගත යුතුව ඇත. අල්ලාහ් දෙවිඳු අප ආයුෂ කාවදා තෙක් දික් කර ඇත්දැයි අප කිසිවෙක් නොදනිමු. ඒ මොහොත අප වෙත ලඟාවන්නට පෙර නොදැනුවත්ව අප පිළිගෙන සිටී විරාගත සංකල්පයෙන් ගැලවී අල්ලාහ් දෙවිඳුගේ ආශිර්වාද ලත් අය අතරට අපද එක් වන්නට අල්ලාහ් දෙවිඳු අප සැමට පිටිවහල් විය යුතුය.

අප දෙවියනි, අප ඔබට කළ යුතුව ඇති බොහෝ යුතු කම් නොදැනුවත්කම නිසා අප අතපසු කර ඇත්තෙමු. එසේම ඔබ නොකළ යුතුයැයි අණ කළ බොහෝ කර ඇත්තෙමු. තවද දහමීය පිළිවෙත් යැයි සිතා දහම ආඥා නොකළ බොහෝ දේ මුග්ධ ලෙස කර අප ජීවිත විනාශ මුඛයට ඇතුලත් කර ඇත්තෙමු. ෂයිතාන්ට වහල්වී නොදැ

නුවත්ව අනෙකුත් අනේක මතිමතාන්ද අන්තානුකරණයෙන් පිළිගෙන ගෙවා දැමූ අවධියක් ගැන දැන් අප දුක් වන්නෙමු. එසේ ගෙවා දැමූ අවධිය ගැන පශ්චාත් තාප වී ඉතසිතින් ඔබගෙන් පව් සමාව අයැද සිටිමු. එහෙයින් අපගේ පවද අප දෙමාපියන් සහ අනෙකුත් අයගේ පවද කමා කර ඔබ සුදනන් වෙනුවෙන් සකස් කර ඇති ෆිර්දව්ස් නම් ස්වර්ගයේ අප සියළු දෙනා ඇතුල් වන්න අපට අනුග්‍රහය දක්වනු මැනවි.

وصلى الله تعالى وسلم على نبينا محمد وآله وصحبه وسلم.

# كيف
# اهتديت إلى التوحيد؟

## باللغة السنهالية

تأليف

الشيخ/ محمد جميل زينو

الترجمة

عبد الحكيم محي الدين

المراجعة

محمد ناصم

دار الورقات العلمية للنشر والتوزيع

الرياض ٣٢٦٥٩ ص.ب ١١٤٣٨ هاتف :٤٢٢٨٨٣٧ ناسوخ ٢٩٣٣٤٠٧

# كيف اهتديت إلى التوحيد

إعداد :
محمد بن جميل زينو

ترجمة :
عبدالحكيم محي الدين

ردمك ٠-٨-٩٥٨٣-٨-٩٩٦٠

دار الورقات العلمية للنشر والتوزيع
الرياض - الشفا - هاتف: ٤٢٨٨٣٣٧ - فاكس: ٤٢٨٣٤٠٧

Designed By : BANAN 012673455